ශ්‍රී ලංකා විදේශ සේවා

නියුක්ති කාර්යාංශය

2020

වාර්ෂික වාර්තාව



CM 36496 - 25 (2022/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පටුන

සමාලෝචනය	පිටුව
අප ගැන	02
2020 වසර සැකැවින්	05
සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවිඩය	06
අධ්‍යක්ෂ මණ්ඩලය	07
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	08
කොවිඩ් වසංගතයට ප්‍රතිචාර දැක්වීම	09

කාර්යසාධනය

විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබාදීම **11**

බලපත්‍රකරණය 11

රැකියා ඇණවුම් අනුමත කිරීම හා රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය 12
නීති පැනවීම 14
ව්‍යාපාර ආරවුල් නිරාකරණය 16

ශ්‍රී ලංකාවෙන් බැහැරව රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ගේ හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුරක්ෂිතතාවය හා සුභසාධනය සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම **16**

පැමිණිලි නිරාකරණය 16
සුභසාධන සේවා 17
පැය 24 පුරා තොරතුරු සේවාව 19
මව්රටට පැමිණි අයවළුන්ට සහය සේවා සැපයීම 20

ශ්‍රී ලංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම **21**
පුහුණු කිරීම් 21
බඳවා ගැනීම් 23
රැකියා ප්‍රවර්ධනය 25

විදේශ ජාලයේ මෙහෙයුම් කටයුතු
විදේශයන්හි ශ්‍රී ලංකා රාජතාන්ත්‍රික දූත මණ්ඩලවල රැකියා හා සුභසාධන අංශ **26**

පරිපාලනය හා යටිතල පහසුකම් **29**
පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීම **30**
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ **අනුබද්ධිත ආයතනය** **31**

මූල්‍ය සමාලෝචනය

මූල්‍ය විශ්ලේෂනය **32**
මූල්‍ය ප්‍රකාශන **35**

විශ්ලේෂණය

විගණකාධිපතිවරයාගේ වාර්තාව **88**
විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ නිරීක්ෂණ **97**

සමාලෝචනය

අප ගැන....

ශ්‍රී ලංකාව තුළ විදේශ රැකියා කර්මාන්තයේ පාලනය හා නියාමණය සඳහා පූර්ණ අධිකාරි බලය අප සතුවේ.

විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළෙඳපොළ විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය

අංක 2187/27 හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළෙඳපොළ විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

1994 අංක 04 හා 2009 අංක 56 දරණ පනත්වලින් සංශෝධිත 1985 අංක 21 දරණ පාර්ලිමේන්තු පණතේ විධිවිධාන යටතේ ශ්‍රී ල.වි.සේ.නි.කා. ස්ථාපිත කරන ලදී

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය 1996 වසරේ ස්ථාපිත කරන ලද අතර එය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පූර්ණ හිමිකාරත්වය සහිත අනුබද්ධිත ආයතනයකි.

දැක්ම

“එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම”

ප්‍රධාන අරමුණු

- විදේශ රැකියා කර්මාන්තය නියාමණය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබාදීම
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින් හා මෙරට සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය හා සුරක්ෂිතතාව සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම
- ශ්‍රී ලංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම

මෙහෙවර

“දේශීය ආර්ථිකයට දායක වෙමින් හා සියලුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවයන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම”

තත්ත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එහි සේවාවන්හි ගුණාත්මකභාවය අඛණ්ඩව ඉහළ නංවමින් පාරිභෝගික තෘප්තිය අතික්‍රමණය කිරීම පිණිස කාර්‍යක්ෂම හා ඵලදායී සේවා සැපයීම සඳහා කැපවී සිටී.

දේශීය හා ජාත්‍යන්තර ජාලය

ප්‍රධාන කාර්යාලයේ අංශ හා තලාහේන කාර්යාලය: අංශ 29

ප්‍රධාන කාර්යාලය: 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල



ප්‍රාදේශීය කාර්යාල : 06

අනුරාධපුරය	බදුල්ල
මහනුවර	කුරුණෑගල
රත්නපුර	වවුනියාව

දිස්ත්‍රික් මධ්‍යස්ථාන: 08

අම්පාර	යාපනය
මඩකලපුව	පොළොන්නරුව
හලාවත	ත්‍රිකුණාමලය
දඹුල්ල	ගාල්ල

සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන : 02
මතුගම
තංගල්ල

පුහුණු මධ්‍යස්ථාන :02
පන්නිපිටිය
කුරුණෑගල

අපගේ ශ්‍රම බලකාය
1169



ශ්‍රී ලාංකීය විදේශ රාජතාන්ත්‍රික කාර්යාලවල රැකියා හා සුභසාධන අංශය : 16

අබුඩාබි	බහරේන්	සයිප්‍රස්	ඩුබායි	ඊශ්‍රායලය	ලෙබනන්
මැලේසියාව	මාලදිවයින	ඕමානය	කටාර්	ජෙඩා	රියාද්
ජෝර්දානය	සිංගප්පූරුව	කුවේට්	දකුණු කොරියාව		

2020 වසර සැකැවින්

53,875

පුරුෂ : 32589
ස්ත්‍රී : 21286

විදේශ රැකියා සඳහා ලියාපදිංචිවීම්

එක්සත් අරාබි එමීර් රාජ්‍ය, කටාර්, සෞදි අරාබිය

ශ්‍රමිකයින් ලබා ගන්නා ප්‍රධාන රටවල්

ශ්‍රී ල.රු. (බිලියන)
1,317
ඇ.ඩො. (මිලියන)
7,103.9

විදේශ ප්‍රේෂණ

රු.මි
2,411

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වියදම

වෘත්තීමය	:	2954
මධ්‍ය මට්ටමේ	:	1498
පුහුණු	:	16733
ලිපිකාර හා ආශ්‍රිත	:	2493
අර්ධ පුහුණු	:	749
අඩු නිපුණතාවයකින් යුත් ගෘහ සේවකයින්	:	14061
අර්ධ පුහුණු	:	15387

මුළු ලියාපදිංචිවීම්(මිනිස්බල මට්ටම්)

රු.මි
1,781

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ආදායම

රු.මි
895.23

සේවක සුබසාධන අරමුදලේ වියදම



සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවිඩය

2020 වසර කොවිඩ් -19 වසංගතය නිසා ඉතාමත් අභියෝගාත්මක වසරක් වූ අතර සමස්තයක් ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වසර පුරාම විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේය.කොවිඩ් 19 ගෝලීය වසංගතය සංක්‍රමණ චක්‍රයට දැඩි බලපෑම් එල්ල කර ඇති අතර, එහි ප්‍රධාන අංගය වන මිනිසාගේ සෞඛ්‍යය අර්බුදයකට ලක් කර ඇත.මූලික වශයෙන් මෙම තත්වයේ බලපෑම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන ආදායම ඉවතට ඇද දැමීය.වසංගතයෙන් සංක්‍රමණික සේවකයින්ට සහ සංක්‍රමණික කවයේ අනෙකුත් අංශවලට සිදු වූ ප්‍රතිවිපාකද ඉමහත්ය.

කර්මාන්තයේ අසාර්ථක වීම් වලක්වා ගැනීම සඳහා සහ ආයතනයට සිදුවන මූල්‍යමය පාඩු වළක්වා ගැනීම සඳහා හදිසි අවධානයක් අවශ්‍ය අංශ හඳුනා ගනිමින් එහි රෙගුලාසි ප්‍රතිව්‍යුහගත කරමින් සිය මෙහෙයුම් සැළසුම් කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සිදු විය.මෙම තත්ත්වය තුළ, කොවිඩ් -19 වසංගතයට ප්‍රතිචාර වශයෙන්, සංක්‍රමණික සේවකයින් සඳහා ජාතික කොවිඩ් -19 ප්‍රතිචාර සැලැස්ම සකස් කළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, සභාපතිවරයාගේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විගමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)යන ආයතනවල සාමාජිකයින්ගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවීය.ඒ අනුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දේශීය හා රැකියා සඳහා පිටත්ව ගිය රටවල වින්දිතයින්ගේ ගැටලු නිරාකරණය කිරීම සිදු කළේය.

2020 වසරේදී වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍යමය ආදායම විශාල ලෙස අඩු වී ඇති අතර එය 2019 දී වාර්තාවූ මිලියන 4,218ට සාපේක්ෂව 2020 වසරේදී අපගේ ආදායම රුපියල් මිලියන 1781 ක තරම් සැලකිය යුතු බලපෑමක් ඇති විය.2020 දී විදේශ සේවක ප්‍රේෂණ රුපියල් බිලියන 1,317 ක් වූ අතර එය 2019 දී ඩොලර් 6,717 ට සාපේක්ෂව 2020 දී ඩොලර් 7,103 දක්වා වැඩිවීමක් ලෙස වාර්තා වී ඇත. විදේශ රැකියා සඳහා ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව 53,875 කි.

මෙම ගෝලීය වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම ඵලදායිතාවයෙන් දායක වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කමල් රත්වත්තේ මහතාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ මඟ පෙන්වීම සිහිපත් කරමි.කම්කරු කැබිනට් අමාත්‍ය සහ විදේශ රැකියා හා වෙළෙඳපොළ විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය සහ අමාත්‍යාංශ නිලධාරීන්ගේ මඟ පෙන්වීම, සහ උපදෙස් වෙනුවෙන් මම සෑම විටම කෘතඥ වෙමි.මෙම කාලය තුළදී අපේම කාර්යමණ්ඩලය කැප වී වැඩ කිරීම සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් ලබා දුන් සහයෝගය මෙහිදී ඇගයීමටත් ප්‍රශංසාවටත් ලක් කරමි.

අනෙකුත් සියලුම පාර්ශවකරුවන් හා විදේශ රටවල සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව මෙම දරුණු තත්වය තුළදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙත ලබා දුන් සහය හා දායකත්වය බොහෝ සෙයින් ප්‍රශංසනීයය.

මෙවන් සියලු අභියෝග හමුවේ වුවද, අපි අපගේ කායශූර මානව සම්පත සමඟින් අපගේ ඉලක්ක සපුරා ගැනීමට නැඟී සිටින අතරම ජාත්‍යන්තර වෙළඳපොලේ නව ප්‍රවණතා වෙත ගමන් කරමින් සිටිමු.

මේජර් ජෙනරාල් මහින්ද හතුරුසිංහ
සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පණතේ 5වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ල.වි.සේ.නි. කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන අතර එය සමන්විත වන්නේ;

මුදල් අමාත්‍යාංශය - 01ක් සාමාජිකයෙක්
විදේශ කටයුතු අමාත්‍යාංශය - 01ක් සාමාජිකයෙක්
වනිතා කටයුතු අමාත්‍යාංශය - 01ක් සාමාජිකයෙක්
බලයලත් විදේශ රැකියා නියෝජිතායතනවලින් - සාමාජිකයින් 4ක්
විදේශ රැකියා විෂයභාර අමාත්‍යාවරයා විසින් පත් කරනු ලබන– සාමාජිකයින් 4ක් වශයෙනි

2020.01.16 දින සිට 2020.12.31 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය

1.	කමල්නීල් සේනක රත්වත්තේ මහතා	සභාපති
2.	නිමල් පියරත්න තිබ්බොටුමුනුව මහතා	අධ්‍යක්ෂ
3.	කේ.ඩී.ආර්. ඔල්ගා මිය.	අධ්‍යක්ෂ
4.	ඒ. ශ්‍රියාණි පද්මලතා මිය. (2020.01.31)	අධ්‍යක්ෂ
5.	කේ.එම්.එස්.ඩී. ජයසේකර මිය. (2020.09.08)	අධ්‍යක්ෂ
6.	ඒ.ජී.එම්.වී. විශ්වනාත් මහතා	අධ්‍යක්ෂ
7.	ආනන්ද ගුණතිලක මහතා	අධ්‍යක්ෂ
8.	ජී.එම්.එල්. සම්පත් මහතා	අධ්‍යක්ෂ
9.	අබ්දුල් රාසික් මොහමඩ් ගවූස් මහතා	අධ්‍යක්ෂ
10.	බුද්ධි ප්‍රදීප් නියදඩුපොල මහතා	අධ්‍යක්ෂ
11.	ඩබ්. ශිරෝමන් හේමන්ත සපුමොහොට්ටි මහතා	අධ්‍යක්ෂ
12.	මාදරන්ගේ ලංකා විජිත කුමාර මහතා	අධ්‍යක්ෂ

ජ්‍යෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



කොවිඩ් -19 වසංගතයට ප්‍රතිචාර දැක්වීම

කොවිඩ් -19 වසංගතය හා ශ්‍රී ලාංකික විගමණික සේවකයින්ට එයින් සිදුවන බලපෑමට ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විගමණික සේවකයින් උදෙසා වන ජාතික කොවිඩ් -19 ප්‍රතිචාර සැලැස්ම සකස් කර ඇත.මෙය ස්ථාපිත කර ඇත්තේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය(IOM) හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) සහය ඇතිවය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා 2020 අප්‍රේල් 30 වන දින ශ්‍රී.ල.වි.සේ.නි. කාර්යාංශයේ සාමාජිකයින්, විගමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් (ILO) සැදුම්ලත් ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවන ලදී. මෙම සැළැස්ම සකස් කිරීමේ සිවිල් සංවිධාන, වෘත්තීය සමිති, බලයයලත් විදේශ රැකියා නියෝජිතායතන (ALFEA) සංගමයේ යෝජනා හා නිර්දේශද සැළකිල්ලට භාජනය කරන ලදී.මෙම ක්‍රියාවලිය මඟින් සියලුම පාර්ශවකරුවන්ගේ අදහස්, එනම් රජයේ නිලධාරීන්, විගමණික විශේෂඥයින්, ALFEA සහ ජාත්‍යන්තර සංවිධාන යන පාර්ශවයන්හි අදහස් හා නිරීක්ෂණයන් නිසි ලෙස සැලකිල්ලට ගත් බවට සනාථ කෙරිණ.

පහත පියවර පහ යටතේ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මෙම ප්‍රතිචාරී සැළැස්මේදී සැළකිල්ලට භාජනය කෙරිණ.

1. සංක්‍රමණය කරන රටේදී (country of destination) ගත යුතු ක්‍රියාමාර්ග
2. ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමේදී ගත යුතු ක්‍රියාමාර්ග
3. පිවිසුම් අවස්ථාවේදි හා පැමිණි පසු වහාම ගත යුතු ක්‍රියාමාර්ග
4. ශ්‍රී ලංකාවට ආපසු පැමිණ සමාජගතවීමේදී ගත යුතු ක්‍රියාමාර්ග
5. නැවත සංක්‍රමණය වනවිට ගත යුතු ක්‍රියාමාර්ග

ඉහත කී ක්‍රියාමාර්ග ඒ සඳහා ඇති මුදල් ප්‍රතිපාදන හා ඒ ඒ පාර්ශවයන්ගේ වගකීම් අනුව නිර්දේශිත ක්‍රියාමාර්ග ක්ෂණික, කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන වශයෙන් වර්ගීකරණය කරන ලදී.

වසංගත තත්වයේ මුල් භාගයේදී, කොවිඩ් -19 හේතුවෙන් දුෂ්කරතාවයන්ට මුහුණ දුන් විගමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් පිළිබඳ තොරතුරු දේශීය වශයෙන් පැය 24 පුරාම ක්‍රියාත්මකව පවතින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 24-පැය තොරතුරු මධ්‍යස්ථානය සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් රැස් කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කටයුතු කළේය. වින්දිතයින් හඳුනා ගැනීමට,එකී ගැටලු වළකාගැනීමට හා වින්දිතයින්ගේ ආරක්ෂණය තහවුරු කිරීම පිණිස කඩිනම් පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ මෙම ක්‍රියාවලිය ආරම්භ කළේය.

මෙම ගෝලීය වසංගතය සම්බන්ධව අනුගමනය කළ යුතු සෞඛ්‍ය මාර්ගෝපදේශන රජයේ උපදෙස් ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය ඔස්සේ පල කිරීමටත්, එමගින් විගමණික සේවකයින් අතර දැනුවත්කම ඇති කිරීම පිණිස පුළුල් වැඩසටහනක් දියත් කිරීමටත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කටයුතු කළේය.

ඊට අමතරව, කෙටි කාලීන කාලසීමාව තුළදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය ක්‍රියාමාර්ගවලට අනුව යමින්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වියදම් අඩු කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවල කාර්ය මණ්ඩලය අඩු කිරීමට තීරණය කළේය.ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යය මණ්ඩලයට ආරක්ෂක උපකරණ සපයා දුන් අතර දෛනික වැඩ කටයුතුවලදී සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කළහ.

විගමණික සේවකයින් මෙන්ම ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට ඇති වී තිබූ ගැටලු සැලකිල්ලට ගෙන, ඔවුන් පිටත්ව යාමට පෙර, රැකියාවේදී සහ පැමිණීමෙන් පසු යන අවස්ථාවලට අදාළව විගමණික සේවකයාට අදාලවන නීති / ක්‍රියා පරිපාටි සුදුසු පරිදි සකස් කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පියවර ගත්තේය.මෙම තත්වය තුළ ක්ෂණික පියවරක් ලෙස පිටත්ව යාමට පෙර අවස්ථාවේදී කාන්තා සේවකයින් සඳහා අනිවාර්ය වන පවුල් පසුබිම් වාර්තාවේ (FBR) වලංගු කාලය දීර්ඝ කරන ලදී.

කොවිඩ් -19 වසංගතය හේතුවෙන් විදේශ රැකියා කර්මාන්තයට ඇති වූ අභියෝග හා බලපෑම්වලට මුහුණ දෙමින්, දේශීයව පමණක් නොව ගමනාන්තය තුළ වූ සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ගැටලු විසඳීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පියවර ගත්තේය.විදේශගත ශ්‍රමිකයින් සඳහා අවශ්‍ය ආධාර ලබා දීම සඳහා විදේශයන්හි ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවල රැකියා හා සුභසාධන අංශ 16ට රුපියල් 500,000/- බැගින් වෙන් කරන ලද අතර සිදු කරනු ලැබූ ඉල්ලීම් සලකා බලා එම මුදල් වැඩි කෙරිණ. මෙම ගෝලීය වසංගත තත්ත්වය තුළ අපේ ප්‍රජාව ආරක්ෂා කිරීම සඳහා සත්කාරක රටවල සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ සමඟ එක්ව කටයුතු කළ පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය අගය කරන්නෙමු.

මීට අමතරව, ආහාර හා අත්‍යවශ්‍ය අවශ්‍යතා සපයා ගැනීමට අපහසුතාවයට පත් වූ විගමණික සේවකයින් සඳහා රුපියල් 5000/- ක් වටිනා වියළි සලාක මල්ලක් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල වල රැකියා හා සුභසාධන අංශ 16 ට උපදෙස් දෙන ලදි.

2020 වසර අතිශය අභියෝගාත්මක වසරක් වූ අතර කොවිඩ් -19 වසංගතය හේතුවෙන් සිය ආදායමේ සැලකිය යුතු අඩුවීමක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ අත්විඳීය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ විදේශ රැකියා කර්මාන්තයේ පාලනය හා නියාමනය සිදු කරන ප්‍රධාන ආයතනය වශයෙන්, එහි පාර්ශවකරුවන්, ප්‍රධාන වශයෙන් විගමණික සේවකයින් මුහුණ දෙන ගැටලු පිළිබඳව සමීප අවධානයෙන් සිටින අතර, එම තත්ත්වයන් මඟහරවා ගැනීමට විවිධ ක්‍රියාමාර්ග මෙම වසර තුළ අනුගමනය කෙරෙමින් පවතී.









කාර්යසාධනය

විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබාදීම

බලපත්‍රකරණය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව එහි අවශ්‍යතා සපුරාලූ අයවළුන් සඳහා විදේශ රැකියා ව්‍යාපාර කටයුතුවල නිරත වීම පිණිස ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය මගින් බලපත්‍ර නිකුත් කරයි.එම බලපත්‍ර වසරක කාලයක් සඳහා වලංගුවන අතර එය අලුත් කළ හැකිය.





බලපත්‍ර අංශය මඟින් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන (LFEA) සඳහා බඳවා ගැනීම්, දුක්ගැනවිලි හැසිරවීම, නැවත ගෙන්වා ගැනීම සහ විදේශ රැකියා ව්‍යාපාර වල වෙනත් කටයුතු හා බැඳුනු නීති රෙගුලාසි, ප්‍රමිති හා ක්‍රියා පටිපාටි ආදිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. 2020 වසරේදී එවැනි දැණුවත් කිරීමේ වැඩසටහන් 4ක් පවත්වා ඇත.

රටේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් බලපත්‍ර අංශය වර්ෂයට සිදු කිරීමට නියමිත කටයුතු සිදු කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පෑවේය.

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන බහුලව පැවති ප්‍රදේශ වල පනවා තිබූ සංචරණ සීමා නිසා එකී අංශයේ සේවාවන් සඳහා පැමිණීමේ අඩුවීම හේතුවෙන් එය එම කාර්යසාධනයට බලපා ඇත.





රැකියා ඇණවුම් අනුමත කිරීම සහ රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය

ඉහත ක්‍රියාවලීන් දෙක ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙහෙයුම් අංශ දෙකක් මගිනි.

- පළමු අනුමැති අංශය
- අවසන් අනුමැති අංශය

පළමු අනුමැති අංශය බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන විසින් ඉදිරිපත් කරන රැකියා ඇණවුම් හා දැන්වීම් සඳහා අනුමැතිය ලබා දෙයි. එය පෞද්ගලික ප්‍රභවයන් හරහා රැකියා ලබන විගමණික සේවකයින් ලියාපදිංචිය හා ලියාපදිංචිය අලුත් කිරීම සඳහා පහසුකම් සළසයි.(ස්වයං-ලියාපදිංචිවීම්)





අවසන් අනුමැති අංශය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අනුමත කරන ලද රැකියා ඇණවුම් අනුව විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීම සඳහා බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන (LFEA) වෙත සිය අනුමැතිය ලබා දෙයි.

2020 වසරේ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන **හරහා විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් ලියාපදිංචි කිරීම්**



කොවිඩ්-19 වසංගත තත්වයේ බලපෑමත් සමඟ, පසුගිය වසර හා සැසඳීමේදී,බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන හරහා විදේශ රැකියා සඳහා වූ ලියාපදිංචිවල විශාල පහත වැටීමක් එනම්; 2019: 71095 සහ 2018: 67817 වූ ලියාපදිංචි 2020 වසරේ 19385 ලෙස පහත වැටීමක් පහත දැක්වෙන පරිදි දැක ගත හැකි විය.මෙම ගෝලීය වසංගතය හේතුවෙන් දේශීය වශයෙන් හා ගමනාන්ත රටවල පනවා තිබූ සංචරණ සීමාකරමින් විදේශ රැකියා සඳහා පිටත්ව යන විගමණික සේවකයින්ට තහනම් කිරීම නිසා2020 අප්‍රේල් සහ මැයි මාසවලදී එම සංඛ්‍යාව ශූන්‍ය ලෙස වාර්තා වී ඇත.

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන **හරහා ලියාපදිංචි කිරීම: 2018 - 2020**





ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ **පනතේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා සඳහා පිටත්ව යන සෑම ශ්‍රී ලාංකිකයෙකුම එවැනි පිටත්ව යාමට පෙර** ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති **කාර්යාංශයේ ලියාපදිංචි වීම අනිවාර්ය වේ.**ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය මඟින් ලාංකිකයින් විදේශයන්හි සංක්‍රමණය කළ රටවල ඔවුන්ගේ අයිතිවාසිකම් හා අභිලාෂයන් ආරක්ෂා කරන වලංගු රැකියා කොන්ත්‍රාත්තුවක් ඇතිව රැකියාවල නියුක්ත වන බව සහතික කෙරේ.**එලෙස ලියාපදිංචි වන විගමණික ශ්‍රමිකයින් හට** ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය **මඟින් ගාස්තු අය කිරීමකින් තොරව රක්ෂණාවරණයක් පිරිනමනු ලබන අතර එය ඔවුන්ගේ කොන්ත්‍රාත් කාලය සඳහා වලංගු වේ.**ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි අදාළ රැකියා කොන්ත්‍රාත්තුව අනුව වසර දෙකක හෝ අවුරුදු තුනක කාලයක් සඳහා වලංගු වේ.සේවකයින්ට සිය ලියාපදිංචිය ශ්‍රී.ල.වි.සේ.නි. කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය, ශාඛා කාර්යාල සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල හරහා අලුත් කර ගැනීමට පහසුකම් සලසා ඇත.

නීති පැනවීම

නීති විරෝධී ක්‍රියාකාරකම්, අක්‍රමිකතා, පුද්ගලයින් ජාවාරම් තුරන් කිරීම සහ ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කර්මාන්තයේ යෙදෙන ක්‍රියාකාරීන්ගේ යහපත් චර්යාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා වූ සෑම උත්සාහයක්ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ක්‍රියාවේ යොදවයි.මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ රැකියා සොයන්නන්ගේ, විගමණික සේවකයින්ගේ, ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සහ අනෙකුත් පීඩාවට පත් වූ පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සහ අභිලාශයන් ආරක්ෂා කිරීම සඳහා විවිධවූ නීති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරයි.

බලපත්‍රලාභී විදේශ රැකියා ඒජන්සි සහ වෙනත් බලපත්‍ර නොමැති පාර්ශවයන් විසින් සිදු කරනු ලබන නීති විරෝධී බඳවා ගැනීමේ කටයුතු පිළිබඳව ලැබෙන මහජන පැමිණිලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පරීක්ෂණ පවත්වයි.සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීම් සිදු කරන අතර නිසි පරීක්ෂණ පැවැත්වීමෙන් පසු නීතිය උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගනු ලැබේ.

නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශය, නීති අංශය මිනිස් වෙළඳාමට එරෙහි ඒකකය ක්‍රියාත්මක වේ.

විශේෂ විමර්ශන අංශයේ ක්‍රියාකාරකම්	**2019**	**2020**
බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනයට එරෙහිව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම	1762	749
නිරාකරණය කළ පැමිණිලි ගණන (සමුච්ඡිත)	3406	803
වලංගු බලපත්‍රයකින් තොරව විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියැලී සිටින පුද්ගලයින්ට එරෙහිව ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම	779	394
නිරාකරණය කළ පැමිණිලි ගණන	248	199
මිනිස් ජාවාරම (කුට්ටනය), හා මංකොල්ලය වැළැක්වීමට නීත්‍යානුකූල නොවන බඳවාගැනීම් හා සම්බන්ද ක්‍රියාකාරකම් වැටලීම	298	173
සාර්ථක වැටලීම් ගණන	252	173





"එතෙර ශ්‍රමයට නීතියෙන් අත්වැලක්" යනු විදේශ රැකියා කේෂත්‍රයට සම්බන්ධ විවිධ නීති, රෙගුලාසි සහ භාවිතයන් පිළිබඳ දැනුම පුළුල් කර ගැනීමට මෙන්ම කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තම රාජකාරී ඉටු කිරීමට අවශ්‍ය කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනකි.

නීති අංශ විසින් පනවන ලද නඩුවලට අදාලව ලබාදී ඇති දඩුවම් නියෝගවලින් කාර්යාංශය වෙත යොමු කරන ලද 75% මුදල් කාර්යාංශයේ සුභසාධන අරමුදලට ප්‍රේෂණය කිරීම		
	2019	**2020**
නඩු පැවරීමෙන් අයකර ගත්	13,456,770/-	2,622,000/-
පනවන ලද දඩමුදල්	3,424,500/-	2,550,000/-
ශ්‍රී.ල.වි.සේ.නි.කා වෙත ලැබුණු (75%)	1,888,375/-	1,912,750/-
කොරියාවේදී පලායෑම් සම්බන්ධ නඩුව සමථයට පත් කර අය කරගත්	2,900,000/-	3,129,032.50

රාජ්‍ය නිලධාරීන්, මහ ජනතාව, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සහ අනෙකුත් අදාළ පාර්ශවයන් සඳහා මිනිස් ජාවාරම පිළිබඳ නීති සහ මිනිස් ජාවාරමට එරෙහි යාන්ත්‍රණයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී.ල.වි.සේ.නි.කා පවත්වයි.





ව්‍යාපාර ආරවුල් නිරාකරණය කිරීම

විදේශ රැකියා කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර යහපත් චර්යාවන් ප්‍රවර්ධනය කිරීමේ පියවරක් වශයෙන්, අදාළ පාර්ශවයන් අතර, එනම් බලපත්‍රලාභී විදේශ රැකියා ඒජන්සි දෙකක් හෝ වැඩි ගණනක් අතර (විදේශීය රැකියා නියෝජිතායතන) හෝ විදේශ රැකියා සඳහා බඳවා ගන්නා ආයතනය සහ බලපත්‍රලත් විදේශ රැකියා ඒජන්සියක් හෝ බලපත්‍රලත් විදේශ රැකියා ඒජන්සියක් සහ සංක්‍රමණික සේවකයෙකු හෝ රැකියා අපේක්ෂකයෙකු අතර ඇති වන ව්‍යාපාර ආරවුල් නිරාකරණය කර ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මැදිහත් වේ.

ශ්‍රී ලංකාවෙන් බැහැරව රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ගේ හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුරක්ෂිතතාවය හා සුභසාධනය සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම

පැමිණිලි නිරාකරණය

විගමණික සේවකයින්ගෙන් හෝ ඔවුන් වෙනුවෙන් ලැබී ඇති පැමිණිලි විසඳීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙබ් පාදක පැමිණිලි කළමනාකරණ පද්ධතියක් (CMS) ක්‍රියාත්මක කරනු ලබයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ප්‍රධාන කාර්යාලය හෝ දේශීය කාර්යාලයකට හෝ අදාල රටේ පිහිටි ශ්‍රී ලංකාවේ රාජතාන්ත්‍රික දූතමණ්ඩල කාර්යාලයක කම්කරු අංශය යන ස්ථානයකදී ලියාපදිංචි විගමණික ශ්‍රමිකයෙකු හෝ ඔහුගේ/ඇගේ හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයෙකුට පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.

විදේශීය ශ්‍රී ලාංකික රාජතාන්ත්‍රික දූතමණ්ඩල කාර්යාලයක කම්කරු අංශයට/සමඵ අංශවලට අනුයුක්තව සිටින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බලයලත් නිළධාරීන්ට, අදාල බලපත්‍රලාභී විදේශ රැකියා ඒජන්සි හා විදේශ ඒජන්සි ආයතනවලට වෙබ් පාදක පැමිණිලි කළමනාකරණ පද්ධතිය (CMS) ඔස්සේ සන්නිවේදනය කිරීමට හා තොරතුරු වාර්තා කිරීමට පහසුකම් සළසා ඇත.

වන්දි, වැටුප් හා වෙනත් හිඟ ගෙවීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 31 සම්බන්ධයෙන් පීඩාවට පත්ව සිටි විගමණිකයින් වෙනුවෙන් රු. 2,370,612ක් අය කර පීඩාවට පත් වූවන්ට සහයවීමට 2020 වසර තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමත් විය.

2019 හා 2020 වසරවල පැමිණීලි පිළිබඳ වාර්තා



සුභසාධන සේවා

අප ආයතනය විගමණික සේවකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂණය හා සුභසිද්ධිය සහතික කිරීම සඳහා කළ හැකි සෑම උත්සහයක්ම ක්‍රියාවට නංවයි. මෙම සන්දර්භය තුළදී, අපි විගමණික සේවකයින්ගේ, ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආර්ථික ස්ථාවරභාවය හා ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය ඉලක්ක කර ගනිමින් විවිධ සේවා ක්‍රියාත්මක කර ඇත්තෙමු. හදිසි අවස්ථාවලදී සහයවීම, අපි වෛද්‍යමය ආධාර සැපයීම, ආබාධිත විගමණික සේවකයින්ට උපකාර කිරීම වැනි සේවාද සළසා දෙමු.

සුභසාධන ක්‍රියාකාරකම්

- විගමණික සේවකයින් හා පවුලේ සාමාජිකයින්ට වෛද්‍ය ප්‍රතිකාර
- ආබාධිත විගමණික සේවකයින් සඳහා නිවාස
- වෛද්‍ය කඳවුරු
- විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් සඳහා පාසල් උපකරණ
- විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් සඳහා විශේෂ සහය
- විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව
- රක්ෂණ ප්‍රතිලාභ
- හදිසි අවස්ථා හා උවදුරකදී විගමණික ශ්‍රමිකයින්ගේ හා පවුලේ සාමාජිකයින් සඳහා විශේෂ සහය
- ළමාරක්ෂණ වැඩසටහන් පැවත්වීම

විගමණික සේවකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ යහපත සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සේවක සුධසාධන අරමුදල (WWF) පිහිටුවා ඇත. මෙහි අරමුදල් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් ලබා දෙන සුභසාධන සේවා/පහසුකම් ලබා දීමට උපයෝගී කර ගනු ලැබේ.



සේවක සුභසාධන අරමුදල ආදායම (රු.මී)	2020	2019
බඳවා ගැනීම් ගාස්තු- නියෝජිතායතනවලින්	28	104
බඳවා ගැනීම් ගාස්තු- තනි පුද්ගල	28	101
කොරියාවට බඳවා ගැනීම් - ප්‍රවර්ධන ගාස්තු	47	120
කොරියාවට බඳවා ගැනීම් - පුහුණු ගාස්තු	25	68
පුහුණු ආදායම	42	149
විදේශ තානාපති කාර්යාලවලින් ලද ආදායම	249	996
වෙනත් මෙහෙයුම් ආදායම්	0.4	116











සේවක සුභසාධන අරමුදල වියදම (රු.මි)	2020	2019
සුභසාධන ක්‍රියාකාරකම්	204	481
කාර්යමණ්ඩල පිරිවැය (තානාපති කාර්යාලවල කාර්යමණ්ඩල ඇතුළුව)	421	645
ආයතනික පිරිවැය (තානාපති කාර්යාල ඇතුළුව)	209	287
වෙනත් මෙහෙයුම් (තානාපති කාර්යාල ඇතුළුව)	55	72
මූල්‍ය (තානාපති කාර්යාල ඇතුළුව)	5	4
වෙළඳදැන්වීම්/ප්‍රචාරණ (තානාපති කාර්යාල ඇතුළුව)	0.5	1
ව්‍යාපාර ප්‍රවර්ධන (තානාපති කාර්යාල ඇතුළුව)	0.73	1



පැය 24 පුරා තොරතුරු සේවාව

විදේශ රැකියා සම්බන්ධයෙන් ඕනෑම පුද්ගලයෙකුට තොරතුරු සැපයීමට හා විගමණික සේවකයින් හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින අයගෙන් ලැබෙන පැමිණිලි ලබා ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පැය 24 පුරා තොරතුරු සේවාව ක්‍රියාත්මක කරනු ලබයි. ඕනෑම පුද්ගලයෙකුට 1989 යන විශේෂ දුරකථන අංකය හරහා හෝ ඒ වෙනුවෙන්ම ක්‍රියාත්මක වන011-2879900 අංකය මගින් හෝ infor_center@slbfe.lk යන විද්‍යුත් තැපෑල මගින් හෝ ස්කයිප් (24 hours call center –SLBFE) මගින් ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශයේ තොරතුරු මධ්‍යස්ථානය හා සම්බන්ධ විය හැක.

2020 වසර තුළ ශ්‍රී.ල.වි.සේ.නි. කාර්යාංශයේ තොරතුරු මධ්‍යස්ථානය වෙත ලැබුනු විමසීම්	
දුරකථන විමසීම්	160,571
ඊමේල් විමසීම්	3,986





ආපසු මෙරටට පැමිණි අයවළුන්ට සහය සේවා සැපයීම

2008 වසරේ ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය එළි දැක්වීමත් සමඟම විදේශ රැකියා කර්මාන්තයට තවත් වටිනාකමක් එක් කරමින් විගමණික සේවකයින් ආපසු පැමිණීම හා නැවත සමාජගත කිරීම පිළිබඳ උප ප්‍රතිපත්තියක් සහ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් 2015 දෙසැම්බර් මාසයේදී බලාත්මක විය.

ඒ අනුව, විදේශයන්හි සේවයේ යෙදීසිට ආපසු මෙරටට පැමිණෙන විගමණික සේවකයින්ට ආරක්ෂිත හා ගෞරවාන්විතව නැවත පැමිණ සමාජගත වීම සඳහා සහාය වීම සඳහා විශේෂ අංශයක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ විසින් පිහිටුවන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රත්‍යානුකලන අංශය මගින් සිය විෂය පථය තුළ විගමණික සේවකයින්ට ඔවුන්ගේ සමාජයීය හා ආර්ථික වශයෙන් නැවත සමාජගත කිරීම සඳහා උපකාර කිරීම, ඔවුන්ගේ කුසලතා ප්‍රවර්ධනය කිරීම, නැවත සේවයේ නියුක්ත කිරීම සහ නැවත ශ්‍රම බලකායට ඇතුළත් කර ගැනීම ආදී ක්‍රියාකාරකම් රැසක් වර්ෂය තුළ සිදු කරන ලදී.

ක්‍රියාකාරකම	**වැඩසටහන් ගණන**	**තෝරාගත් පුද්ගලයින් ගණන**
ස්වයං-රැකියා සඳහා යොමු වන හා ඊට අවශ්‍ය සහය ලබාදිය යුතු විගමණික සේවකයින් හඳුනා ගැනීමට දැනුවත් කිරීමේ වැඩසටහන් හා කේෂ්ත්‍ර චාරිකා	12	250
ක්‍රියාකාරකම	**ප්‍රතිලාභීන් ගණන**	**මුදල**
ආපසු පැමිණි විගමණික සේවකයින්ගේ දරුවන්ට පාසල් උපකරණ	28	රු.138,667.45







ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම

පුහුණු කිරීම





රැකියා අපේක්ෂකයින්ට විදේශ රැකියා වෙළඳපොලේ රැකියා අවස්ථා ලබා ගැනීමට සහයදීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය පුහුණු අංශ දෙකක් මගින් රැකියා අපේක්ෂකයින්ට පිටත්ව යාමට පෙර අවශ්‍ය කෙරෙන පුහුණුව ලබා දෙයි.

පුහුණු අංශය (ගෘහස්ථ) මගින් ගෘහ පාලිකාවන් හා සාත්තු සේවිකාවන් ලෙස තුන් වන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ලබා ගැනීම සඳහා රැකියා අපේක්ෂකයින් වෙත පුහුණු වැඩසටහන් ලබා දෙයි.

පුහුණු අංශය (ගෘහස්ථ නොවන)අර්ධ කුසලතා හා අඩු කුසලතා සහිත රැකියා අපේක්ෂකයින්ට පිටත්ව යාමට පෙර අවශ්‍ය කෙරෙන පුහුණුව ලබා දෙයි.

මෙම පුහුණු වැඩසටහන් රැකියා අපේක්ෂකයින්ට විදේශ රැකියා ලබාගැනීමටත්, සාර්ථකව එකී රැකියාවල නියැලෙමින් සිය පවුලේ සංවර්ධනයට දායකවීමටත් අගයක් එකතු කරන මූලයක් බවට හඳුනා ගෙන ඇත.

2020 වසරේදී ගෘහස්ථ නොවන පුහුණු අංශය මගින් ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම්		
ක්‍රියාකාරකම	**වැඩසටහන් ගණන**	**පුද්ගලයින් ගණන**
ස්ත්‍රී/පුරුෂ රැකියා අපේක්ෂකයින්ට පිටත්වීමට පෙර අදාල රැකියා පිළිබඳ මූලික හඳුන්වාදීමේ පුහුණුව	319	5498
පුහුණු උපදේශකවරුන්ට පුහුණුකරුවන් පුහුණු කරන (TOT)වැඩසටහන් පැවැත්වීම	02	91
කොරියානු රැකියා අපේක්ෂකයින්ට මනා ශාරීරික සෞඛ්‍යමය තත්වයක් සහතික කිරීම පිණිස පිටත්ව යාමට පෙර පුහුණු වැඩසටහන් පැවැත්වීම	56	2237
ජපන් රැකියා අපේක්ෂකයින්ට මනා ශාරීරික සෞඛ්‍යමය තත්වයක් සහතික කිරීම පිණිස පිටත්ව යාමට පෙර පුහුණු වැඩසටහන් පැවැත්වීම (TITP)	15	118
ජපන් භාෂා පුහුණුව පැවැත්වීම	216	3938





2020 වසරේදී ගෘහස්ථ පුහුණු අංශය මගින් ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම්		
පුහුණු වැඩසටහන	**පැවැත්වූ පන්ති ගණන**	**පුහුණුලාභීන් ගණන**
ගෘහ පාලන සහකාර –මැදපෙරදිග අංශය: දින 21 | NVQ 3 මට්ටම	80	1235
ගෘහ පාලන සහකාර –යුරෝපය සහ නැ. ආසියානු කලාපය: දින 21 | NVQ 3 මට්ටම	16	220
සාත්තු සේවා : දින 45 | NVQ 3 මට්ටම	24	442
සාත්තු සේවා : දින 07	05	11
සාක්ෂරතා පුහුණු වැඩසටහන්-සිංහල හා ද්‍රවිඩ භාෂා | දින18	08	102
IFE පුහුණු වැඩසටහන්: දින07	40	368







බඳවා ගැනීම්

ශ්‍රී ලාංකිකයින් කොරියානු රැකියා සඳහා රැකියා බලපත්‍ර ක්‍රමය **(EPS)** යටතේ බඳවා ගැනීමටශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයපහසුකම් සළසයි**.** මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලාංකාව හා දකුණු කොරියාව අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම (**MoU**) අනුව ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය කොරියානු මානව සම්පත් සංවර්ධන අංශය (HRD) සමඟ සම්බන්ධීකරණයකින් ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී.ල.වි.සේ.නි. කාර්යාංශයේ බඳවා ගැනීමේ අංශය 2017 වසරේ සිට බඳවා ගැනීමේ අංශය (කොරියානු) ලෙස නම් කර ඇත.

රැකියා බලපත්‍ර ක්‍රමය **(EPS)** යටතේ වඩාත් කාර්යක්ෂම බඳවා ගැනීමේ වැඩසටහනක් සහතික කරනු පිණිස බඳවා ගැනීමේ අංශය (කොරියානු) විසින් පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි.

- කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය(ලකුණු ලබාදෙන විභාග ක්‍රමය/**සාමාන්‍ය රැකියා බලපත්‍ර හා විශේෂරැකියා බලපත්‍ර)**
- තෝරා ගත් රැකියා අපේක්ෂකයින්ට පිටත්ව යාමට පෙර අවශ්‍ය කෙරෙන පුහුණුව
- රැකියා (සේවා) ගිවිසුම් නිකුත් කිරීම
- පිටත්ව යාමට පෙර බැංකු ණය ලබාගැනීමට සහයදීම
- පිටත්ව යාමට අවශ්‍ය කටයුතු සළසාදීම
- කොරියානු විශ්‍රාම ලබාගැනීමට සහයවීම (මව්රට බලා නැවත එන්නන්ට)
- “ප්‍රීතිමත් මව්රට පැමිණිම” වැඩසටහන

2018 – 2020 වසර තුළ දකුණු කොරියාව බලා පිටත්වීම



පසුගිය වසර වන 2019: 3580 හා 2018: 3419ට සාපේක්ෂව ගෝලීය කොවිඩ් -19 වසංගතය නිසා සියලුම බාණ්ඩවලින් පිට රටට පිටත්ව යාම 2020 වසරේදී 500 දක්වා අඩු වී ඇත.





ශ්‍රී ලාංකික තරුණයින් ජපානයට බඳවා ගැනීම

ජපාන IM ආයතනය සහ විදේශ රැකියා අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර අත්සන් කළ ගිවිසුම ප්‍රකාරව 2017 වසරේ තාක්ෂණික අභ්‍යන්තර පුහුණු වැඩසටහන (TITP) **ආරම්භ කරන ලදී.**

ජපානයට පිටත්ව යාම **– 2020: 58**







රැකියා ප්‍රවර්ධනය

ශ්‍රී ලාංකිකයින්ට විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දේශීයව හා විදේශීය වශයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. දේශීය ප්‍රවර්ධන වැඩසටහන් මගින් රැකියා අපේක්ෂිතයින්ට වෘත්තීය මාර්ගෝපදේශන සපයයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලවල කම්කරු අංශය හා සම්බන්ධීකරණය කරමින් විවිධ ජංගම සේවා, රැකියා වෙළඳපලවල් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය මගින් සෑම සිකුරාදා දිනයකදීම විකාශනය කෙරුණු ගුවන් විදුලි වැඩසටහනක් වන "විගමණික නවෝදය" මහ ජනයා විදේශ රැකියා සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා විගමණික සේවකයින් වෙතින් ලැබෙන සාර්ථක සංසිද්ධීන් විකාශනය කිරීමට 2020 වසරේ ක්‍රියාත්මක කළ නව ප්‍රවර්ධන වැඩසටහනකි.



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ **මාර්ගස්ථ රැකියා බැංකුව** මගින් රැකියා අපේක්ෂිතයින්ට රැකියා සඳහා ලියාපදිංචි වීමටත් විදේශ රැකියා අවස්ථා සොයා ගැනීමටත් පහසුකම් සළසයි. එමෙන්ම බලපත්‍රලත් විදේශ රැකියා නියෝජිතායතනවලට හා සේවා යෝජකයින්ට ඔවුන් සතුව ඇති පුරප්පාඩු සඳහා සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීමටත් පහසුකම් සළසයි.





බලපත්‍රලත් විදේශ රැකියා නියෝජිතායතනවල (LFEAs) ඇති අනුමැතියලත් පුරුප්පාඩු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය (www.slbfe.lk)ඔස්සේ පල කරන අතර, රැකියා අපේක්ෂිකයින්ට බලපත්‍රලත් විදේශ රැකියා නියෝජිතායතනවල දැනට පවතින විදේශ රැකියා පුරප්පාඩු පිළිබඳව දැන ගැනීමට එමගින් පහසු කෙරේ. එකී වෙබ් අඩවිය මගින් ඒ ඒ විදේශ රැකියා නියෝජිතායතනවල තොරතුරු, පවතින පුරප්පාඩු, අනුමත අවම වැටුප, අවශ්‍ය සුදුසුකම් හා අනුමත බඳවා ගැනීම් ගාස්තු පිළිබඳව රැකියා අපේක්ෂිකයින්ට මෙන්ම ඕනෑම පාර්ශවයකට බලා ගත හැක.

2012 වසරේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ***ISO 9001:2008*** *තත්ත්ව සහතිකය ලබාගෙන ඇති අතර,* ***ISO 9001:2015*** *තත්ත්ව කළමණාකරණ පද්ධතිය දක්වා ඉහළ නංවා ඇත.*

විදේශ ජාලයේ මෙහෙයුම් කටයුතු

විදේශයන්හි ශ්‍රී ලංකා රාජතාන්ත්‍රික දූත මණ්ඩලවල රැකියා හා සුභසාධන අංශ



අබුඩාබි, බහරේන්, සයිප්‍රසය, ඩුබායි, ඊශ්‍රායලය, ජෝර්දානය, ජෙඩා, කුවේටය, ලෙබනනය, මැලේසියාව, මාලදිවයින, ඕමානය, කටාර්, රියාද්, ද. කොරියාව හා සිංගප්පූරුව ඇතුළු රටවල් 14 පිහිටි ශ්‍රී ලාංකාරාජ තාන්ත්‍රික දූතමණ්ඩලවල රැකියා හා සුභසාධන අංශ 16ක් ස්ථාපිත කර ඇත.

ඉහතකී අංශවල මෙහෙයුම් කටයුතු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විදේශීය පරිපාලන හා විදේශ සම්බන්ධතා අංශය අදාල රාජතාන්ත්‍රික දූත මණ්ඩලවල ප්‍රධානීන් හරහා සිදු කරනු ලබන අතර, එමගින් විගමණික සේවකයින්ට සේවා සපයයි.

මෙම අංශය විසින් සිදු කරනු ලබන කටයුතු අතර;

- රැකියා හා සුභසාධන අංශවලට රාජතාන්ත්‍රික නිළධාරීන් හා සහය කාර්යය මණ්ඩලය යෙදවීම
- විදේශ රැකියාවලට බඳවා ගන්නන් හා බැදුණු නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම
- ශ්‍රමය ලබා ගන්නා රටවල් සමඟ ද්වීපාර්ශ්වීය/අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට පහසුකම් සැළසීම
- දේශීය හා විදේශීය වශයෙන් සමුළු,සාකච්ඡා/සම්මන්ත්‍රණ/වැඩමුළු සංවිධානය කිරීම
- අතරමංවූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් මෙරටට ගෙන්වා ගැනීම
- විගමණික සේවකයෙකුගේ මරණයකදී අවශ්‍ය සහය ලබා දීම
- විගමණිකසේවකයෙකු අත්අඩංගුවට, සිරභාරයට, පොලිස්භාරයට පත්වූවිට හා රෝහල්ගත කිරීමකදී අවශ්‍ය සහය ලබා දීම
- ශ්‍රී ලංකා විදේශ තානාපති කාර්යාලවලට ආරක්ෂිත නිවාස පවත්වා ගෙන යාම
- විදේශවලින් පැමිණෙන නියෝජිතයින් පිළිගැනීම හා විදේශවලට නියෝජිතයින් යැවීම
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විගමණික සේවක ලියාපදිංචිය/ ලියාපදිංචිය අළුත් කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම

  ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විදේශවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල නිර්දේශය ප්‍රකාරව අවශ්‍ය විගමණික සේවකයින්ට ශ්‍රී ලංකාවට පැමිණීමට අවශ්‍ය ගුවන් ගාස්තු සපයා දෙනු ලැබේ.

විගමණික ශ්‍රමිකයින් සඳහා සපයන ලද ගුවන් ගාස්තු පිළිබඳ විස්තරය	**2018**		**2019**		**2020**	
	පුද්ගලයින් ගණන	පිරිවැය (රු.මි.)	පුද්ගලයින් ගණන	පිරිවැය (රු.මි.)	පුද්ගලයින් ගණන	පිරිවැය (රු.මි.)
රක්ෂණාවරණ යටතේ	18	0.67	21	0.8	16	0.86
සේවක සුභසාධන අරමුදල යටතේ	7	0.30	19	1.29	8	0.38

2018 -2020: විගමණික ශ්‍රමිකයින් සඳහා සපයන ලද ගුවන් ගාස්තු සඳහා දැරූ පිරිවැය



විදේශ කටයුතු අමාත්‍යාංශයේ හා අදාල ශ්‍රී ලංකා තානාපති කාර්යාල සමග සම්බන්ධීකරණයෙන් මියගිය විගමණික ශ්‍රමිකයෙකුගේ මෘතදේහය මව්රටට ගෙන ඒමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මියගිය විගමණික ශ්‍රමිකයාගේ පවුලේ සාමාජිකයින්ට සහය ලබා දෙයි. එවන් මරණයකදී රක්ෂණාවරණයෙන් ලබා දෙන අවමංගල්‍යාධාරවලට අමතරව විගමණික සේවකයාගේ අවමඟුල් කටයුතු කිරීමට රු.30,000ක මුදලක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ලබා දෙයි.

විස්තරය	2020	
	මෘතදේහ සංඛ්‍යාව	පිරිවැය (රු.මි.)
සේවක සුභසාධන අරමුදල යටතේ මෘතදේහ මෙරටට ගෙන්වා ගැනීම	7	1.43
අවමගුල් වියදම්	114	2.4

අබුඩාබි, ඩුබායි, සයිප්‍රසය, ජෙඩා, ජෝර්දානය, කුවේටය, ලෙබනනය, මැලේසියාව, ඕමානය, කටාර්, රියාද්, යන රටවල් පිහිටි ශ්‍රී ලාංකීය තානාපති කාර්යාලවලට සම්බන්ධව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සුරක්ෂා නිවාස පවත්වා ගෙන යයි. වසර තුළ කාන්තා සේවිකාවන් **1344 කට** ඉහත කී සුරක්ෂා නිවාස නේවාසික පහසුකම් සළසා අත.

මෙම සුරක්ෂා නිවාසවල නේවාසිකයින්ට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ආහාර, වෛද්‍ය පහසුකම්, ගුවන් ටිකට්පත්, ප්‍රවාහණ පහසුකම්, නෛතික සහය හා අනෙකුත් අත්‍යාවශ්‍ය අයිතමයන්/සහය ලබා දී ඇත. පීඩාවට පත්වූ සේවකයින්ට හා ඉහත කී සුරක්ෂා නිවාස පවත්වා ගෙන යාමේ පිරිවැය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවක සුභසාධක අරමුදල (WWF) යටතේ දරනු ලබයි. 2020 වසරේදී (ජනවාරි සිට ඔක්තෝබර් දක්වා) සුරක්ෂා නිවාස පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට වැයවූ මුළු වියදම රුපියල් මිලියන 19.69කි.

විදේශ රටවලදී අත්අඩංගුවට, සිරභාරයට, පොලිස්භාරයට හා රෝහල්ගත කළ විගමණික ශ්‍රමිකයින්ට **සහය ලබාදීම**

වසර	බන්ධනාගාර	පොලිසිය	රෝහල්
2018	167	12	104
2019	60	4	99
2020	81	3	94

ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට ලැබුණු පැමිණිලි

වසර	ලැබුණු පැමිණිලි ගණන	සමථයට පත්කළ
2018	283	273
2019	161	175 (සමුච්ඡිත වූ)
2020	160	113

පරිපාලනය හා යටිතල පහසුකම්

ගිවිසුම්ගත විගමණික ශ්‍රමිකයින්ගේ ආරක්ෂණය හා සුභසාධනය පිළිබඳ වගකීම දරන එකම රාජ්‍ය ආයතනය වශයෙන්, යහපාලනය හා වගකීම වැනි ප්‍රතිපත්තිමය රාමුවක් යටතේ එහි පාර්ශවකරුවන්ට කාර්යක්ෂමවූද, ඵලදායිවූද සේවාවක් ලබාදීමේ මූලික අරමුණ ඇතිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එහි ඇති මානව හා අනෙකුත් සම්පත්ද, තොරතුරු තාක්ෂණයද ඵලදායි අයුරින් මෙහෙයවමින් කළමනාකරණ කටයුතුවල නියැලී සිටී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල ඇති කම්කරු අංශ, බලපත්‍රලාභී දේශීය හා විදේශීය කාර්යාල දේශීය විදේශ රැකියා නියෝජිතායතන හා විදේශීය බඳවා ගැනීම් සිදු කරන ආයතන මැනවින් සම්බන්ධ කරන පුළුල් පරාසයක විහිදුනු ජාලය (The wide area network -WAN) මගින් ආයතනයේ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කරයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් අඩවිය (www.slbfe.lk) ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කර්මාන්තය පිළබඳ විවිධ තොරතුරු සපයන මූලයක් බවට පත්ව ඇත.

පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තම පාර්ශවකරුවන් සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීම මගින් ආයතනයේ ඉලක්ක වෙත ළඟාවීමේදී සිදු කරන කටයුතු මැනවින් හැඩගස්වනු ලබයි.ඵලදායී උපායමාර්ග සංවර්ධනයේ පදනම නිර්මාණය කිරීමෙහිලාපාර්ශවකරුවන්ගේ අදහස් විමසීමේ ක්‍රියාදාමය **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහා** උපකාරී වේ. තරඟකාරී වාසි ලබා ගැනීම සඳහා වැදගත් වන කර්මාන්තය සඳහා අතවශ්‍ය දැ/අවශ්‍යතා හෝ නිරෝධකයන් සැපයීමට පාර්ශවකරුවන්ට හැකියාව පවතී.



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුබද්ධිත ආයතනය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය(SLFEA)

1996දී ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය (**SLFEA**) විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පූර්ණ හිමිකාරිත්වය සහිත එහි අනුබද්ධිත ආයතනයක් ලෙස ස්ථාපිත කෙරිණ. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ කාර්යාලය නාවල, නාරාහේන්පිට පාර, අංක **12**හි පිහිටා ඇත. මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට රැකියා අපේක්ෂිකයින්ට පුහුණු කිරීම මගින් ඔවුන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම හා විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකියන් බඳවා ගැනීම සිදු කරයි. රැකියා අපේක්ෂිකයින් හා විදේශීය සේවායෝජකයින් සම්බන්ධ කරන රජයේ බඳවා ගැනීමේ ආයතනය ලෙස ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය කටයුතු කරයි.

2020-2018 වසරවල ආදායම් හා වියදම් – රු.මි.

	2020	2019	2018
ආදායම්	18	22	36
වියදම්	25	25	30



2018-2020 වසරවල ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය හරහා විදේශ රැකියාවලට පිටත්වීම්



මූල්‍ය සමාලෝචනය
මූල්‍ය විශ්ලේෂනය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සියලුම දේශීය හා විදේශීය කටයුතුවලට සහයදීමේ අරමුණෙන් යුතුව අරමුදල රැස්කිරීම, ආයතනය තුළ මූල්‍ය කළමණාකරණය, ආයතනයේ මූල්‍ය පාලන උපක්‍රමයන් අනුගමනය කරමින් ඵලදායි ලෙස අරමුදල් උපයෝජනය කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය අංශයේ වගකීමයි.

අප සමූහයේ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය **හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ ආදායම 2020-2018(රු.මි.)**

	2020	2019	2018
<u>සමූහය (Group)</u>			
ලාභය	1,799	4,241	4,507
බද්දට පෙර ලාභය	-638	1,046	1,532
බද්දෙන් පසු ලාභය	-744	756	1,171
ජංගම නොවන වත්කම්	2,166	2,309	2,714
ජංගම වත්කම්	14,563	14,679	14,047
ජංගම වගකීම්	1,867	1,765	1,893
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය			
ලාභය	1,781	4,218	4,471
බද්දට පෙර ලාභය	-631	1,049	1,525
බද්දෙන් පසු ලාභය	-737	759	1,166
ජංගම නොවන වත්කම්	2,088	2,244	2,648
ජංගම වත්කම්	14,441	14,554	13,898
ජංගම වගකීම්	1,817	1,715	1,820
ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය			
ලාභය	18	22	36
බද්දට පෙර ලාභය	-7	-3	6
බද්දෙන් පසු ලාභය	-7	-3	4
ජංගම නොවන වත්කම්	78	124	73
ජංගම වත්කම්	123	72	149
ජංගම වගකීම්	49	51	75

අප සමූහයේ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ ආදායම 2020-2019



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ **ප්‍රධාන ආදායම්**

	2020	2019	2018
බඳවා ගැනීමේ ගාස්තු- ඒජන්සිය	83	311	300
බඳවා ගැනීමේ ගාස්තු- පුද්ගල	276	1018	1151
කොරියානු බඳවාගැනීම් ප්‍රවර්ධන ගාස්තු	48	120	103
පහසුකම් සඳහා ගාස්තු	11	41	42
බලපත්‍ර ගාස්තු	42	62	52
සෙස් ආදායම	55	198	194
කොරියානු පරිපාලන ගාස්තු	5	14	12
කොරියානු නැවත ඇතුළත් කිරීමේ ගාස්තු	7	14	16
පුහුණු ආදායම	25	68	33
විදේශ දූත මණ්ඩලවලින් ලැබෙන ආදායම	274	1080	1172
මූල්‍ය ආදායම	765	994	890





අපේ බැංකුකරුවන්

ලංකා බැංකුව BANK OF CEYLON இலங்கை வங்கி

PEOPLE'S BANK THE PULSE OF THE PEOPLE

NSB National Savings Bank

SMIB

මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
විස්තීරණ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

	සටහන්	සමූහය 2020 රු.	සමූහය 2019 රු.	ශ්‍රී.ල.වි.සේ.නි.කා. 2020 රු.	ශ්‍රී.ල.වි.සේ.නි.කා. 2019 රු.
ආදායම	**4**	876,485,748	3,087,494,421	868,962,553	3,075,269,084
වෙනත් ආදායම්	**5**	148,219,968	149,179,964	146,145,874	149,366,715
		1,024,705,716	**3,236,674,385**	**1,015,108,427**	**3,224,635,799**
වියදම්					
කාර්ය මණ්ඩල පිරිවැය	**6**	1,482,421,649	1,759,589,064	1,467,494,641	1,743,826,083
ආයතනික වියදම්	**6**	395,050,377	529,559,467	391,063,027	525,133,978
මෙහෙයුම් වියදම්	**6**	304,649,948	332,113,975	298,846,378	326,911,573
මූල්‍ය වියදම්	**6**	33,806,973	9,571,659	33,725,912	9,455,315
වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණය	**6**	6,920,736	13,814,795	6,869,123	13,681,253
වෙළඳ ප්‍රවර්ධන වියදම්	**6**	9,401,832	68,794,935	9,172,186	68,785,489
සුබසාධන අරමුදල හා වෙනත් වියදම්	**6**	204,269,330	481,486,840	204,269,330	481,486,840
		2,436,520,844	**3,194,930,735**	**2,411,440,597**	**3,169,280,531**
මූල්‍ය ආදායම	**7**	774,130,758	1,004,890,788	765,577,719	994,294,952
		774,130,758	**1,004,890,788**	**765,577,719**	**994,294,952**
			-		
බදු අයකිරීමට පෙර ලාභය (අලාභය)		**(637,684,370)**	**1,046,634,438**	**(630,754,450)**	**1,049,650,220**
			-		
බදු වියදම්	**8**	(106,206,904)	(290,231,707)	(106,206,904)	(290,231,707)
			-		
බදු අයකිරීමෙන් පසු ලාභය		**(743,891,274)**	**756,402,731**	**(736,961,354)**	**759,418,513**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
විස්තීරණ ආදායම් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

	සමූහය	සමූහය	ශ්‍රී.ල.වි.සේ.නි.කා.	ශ්‍රී.ල.වි.සේ.නි.කා.
	2020	**2019**	**2020**	**2019**
	රු.	රු.	රු.	රු.
බදුපසු ලාභය	(743,891,274)	756,402,731	(736,961,354)	759,418,513
වෙනත් විස්තීරණ ආදායම්				
පශ්චාත් සේවක ප්‍රතිලාභ පිළිබඳ ආයු ගණක ලාභ/ අලාභ	(50,158,579)	(15,118,552)	(49,977,107)	(15,224,572)
වර්ෂය සඳහා වූ වෙනත් විස්තීරණ ආදායම්වල මුළු ගණන, ශුද්ධ බදු	**(50,158,579)**	**(15,118,552)**	**(49,977,107)**	**(15,224,572)**
වර්ෂයේ මුළු විස්තීරණ ආදායම	**(794,049,853)**	**741,284,179**	**(786,938,461)**	**744,193,941**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනට

	සටහන්	සමූහය 2020	සමූහය 2019	ශ්‍රී.ල.වි.සේ.නි.කා. 2020	ශ්‍රී.ල.වි.සේ.නි.කා. 2019
වත්කම්		රු.	රු.	රු.	රු.
ජංගම නොවන වත්කම්					
අස්පෘශ්‍ය වත්කම්	9	1,000	4,825,000	1,000	4,825,000
භාවිතයට හිමිකමක් ඇති වත්කම්	10.1	196,765,088	122,378,554	196,765,088	122,378,554
දේපොළ, යන්ත්‍ර හා උපකරණ	10.2	1,604,817,540	1,749,293,489	1,521,103,398	1,679,448,370
අනුබද්ධිත සමාගම්වල ආයෝජන	11	-	-	5,000,000	5,000,000
කාර්ය මණ්ඩල ණය	12.1	255,265,156	259,618,773	255,265,156	259,618,773
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල ණය	12.2	88,259,166	105,977,521	88,259,166	105,977,521
ජංගම නොවන මූල්‍ය වත්කම්	13	2,282,516	47,708,016	2,282,516	47,708,016
පෙර ගෙවීම් හා වෙනත් ලැබීම්	15	14,569,096	15,016,767	14,569,096	15,016,767
ඉදිකෙරෙමින් පවතින ගොඩනැගිලි	10.3	4,621,324	4,621,324	4,621,324	4,621,324
		2,166,580,886	**2,309,439,444**	**2,087,866,744**	**2,244,594,325**
ජංගම වත්කම්					
ඉන්වෙන්ටරිය	14	13,706,045	15,818,469	13,433,630	15,527,639
ජංගම මූල්‍ය වත්කම්	13	9,661,072,818	9,886,845,720	9,555,703,132	9,785,077,449
අතිරික්ත භාරකාර අරමුදල		-	21,912,150	-	21,912,150
කාර්ය මණ්ඩල ණය	12.1	100,273,374	99,073,001	97,160,884	96,375,042
පෙර ගෙවීම් හා වෙනත් ලැබීම්	15	1,184,243,308	1,114,044,114	1,175,967,465	1,106,198,140
විවිධ අත්තිකාරම්		31,867,595	39,216,691	31,843,456	39,056,598
මුදල් හා මුදල්වලට සමාන දෑ	16	3,572,144,531	3,502,602,083	3,566,510,654	3,490,201,565
		14,563,307,671	**14,679,512,228**	**14,440,619,221**	**14,554,348,583**
මුළු වත්කම්		**16,729,888,557**	**16,988,951,672**	**16,528,485,965**	**16,798,942,908**
හිමිකම් හා වගකීම්					
හිමිකම්					
ප්‍රාග්ධනය		691,161,789	691,161,789	691,161,789	691,161,789
සමුච්චිත අරමුදල		10,028,954,979	10,787,957,048	9,906,669,322	10,658,559,845
ප්‍රත්‍යාගණන සංචිත		66,167,346	49,522,346	41,713,346	41,713,346
ප්‍රදාන		58,760	-	58,760	-
මුළු හිමිකම්		**10,786,342,874**	**11,528,641,183**	**10,639,603,217**	**11,391,434,980**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනට

	සටහන්	සමූහය 2020 රු.	සමූහය 2019 රු.	ශ්‍රී.ල.වි.සේ.නි.කා. 2020 රු.	ශ්‍රී.ල.වි.සේ.නි.කා. 2019 රු.
ජංගම නොවන වගකීම්					
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	3.11	230,658,845	160,717,288	226,794,082	158,079,070
කුවේට් වන්දි මුදල් සංචිතය	21	3,513,238,064	3,345,548,116	3,513,238,064	3,345,548,116
විලම්භිත බදු වගකීම්	18.1	172,078,752	91,700,873	172,343,405	91,965,526
බදු වගකීම්		159,146,659	96,693,160	159,146,659	96,693,160
පොළිය සහිත ණය ගැනීම්		1,650,000	-	-	-
		4,076,772,320	**3,694,659,437**	**4,071,522,210**	**3,692,285,872**
ජංගම වගකීම්					
බදු	18.2	169,530,386	211,528,493	171,496,799	213,494,906
නියෝජිතායතන ණය හිමියන්		280,500,876	307,421,950	281,344,569	308,486,144
උපචිත වියදම්		104,985,640	90,330,829	101,369,054	86,195,918
විවිධ ණය හිමියන් හා ණය ගැනීම්	19	1,257,811,782	1,123,236,562	1,211,021,496	1,073,927,929
බදු වගකීම්		43,389,086	24,926,676	43,389,086	24,926,676
විගමණික සේවකයන්ගේ දායකත්වය		8,739,534	8,190,483	8,739,534	8,190,483
කෙටිකාලීන ණය		1,800,000			
ගෙවියුතු ලාභාංශ සඳහා බදු		16,059	16,059	-	-
		1,866,773,363	**1,765,651,052**	**1,817,360,538**	**1,715,222,058**
මුළු හිමිකම් හා වගකීම්		**16,729,888,557**	**16,988,951,672**	**16,528,485,965**	**16,798,942,908**

07 වන පිටුවේ සිට 53 වන පිටුව දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සමෝධානික කොටසක් ලෙස ක්‍රියාකාරයි. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.06.01 දින අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් පහත අය අත්සන් තබා ඇත.

එල්. ඒ. පී. කේ. ලියන්වල
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

කමල් රත්වත්තේ
සභාපති

එන්. පී. තිබ්බොටුමුණුව
අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

		සමූහය 2020 රු.	සමූහය 2019 රු.	ශ්‍රී.ල.වි.සේ.නි.කා. 2020 රු.	ශ්‍රී.ල.වි.සේ.නි.කා. 2019 රු.
මෙහෙයුම් කටයුතු වලින් සැදුම්ලත් මුදල් ප්‍රවාහය					
බදු අයකිරීමට පෙර ශුද්ධ ලාභය		**(637,684,370)**	**1,046,634,438**	**(630,754,450)**	**1,049,650,220**
ගැලපුම					
ක්ෂයවීම්		227,546,527	160,438,961	224,728,168	159,148,586
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		4,824,000	5,125,000	4,824,000	4,825,000
පොළී ආදායම		(774,130,758)	(1,004,890,788)	(765,577,719)	(994,294,952)
මූල්‍ය වියදම්		33,806,973	9,571,659	33,725,912	9,455,315
විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන			17,323,963		17,323,963
කාර්යමණ්ඩල ණය-SLFRS			24,528,813		24,528,813
පොලී වියදම්-SLFRS			27,522,739		27,522,739
බදු කුලී වියදම්		447,671	447,671	447,671	447,671
ප්‍රත්‍යාගණන අතිරික්තය		16,645,000	-	-	-
දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ඇති වූ ලාභය/පාඩුව		188,069	(10,242,723)	233,069	(10,242,723)
විනිමය ලාභ		(120,329,631)	56,439,176	(120,162,801)	56,228,425
ශ්‍රී.වි.ඇ.නියෝජිතායතන ණය සඳහා පොලිය		(12,500)	(12,500)	(12,500)	(12,500)
ප්‍රදානවලින් ලද ආදායම		(11,240)	-	(11,240)	-
වර්ෂය සඳහා ගැලපීම		(154)	(20,307,733)		(20,054,615)
ක්ෂය ප්‍රතිපාදන ඌණ වෙන් කිරීම්		(83,403)	-	(83,403)	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්			(650,000,000)		(650,000,000)
පාරිතෝෂික වෙන්කිරීම්		30,742,390	24,274,359	30,223,510	23,803,098
		(1,218,051,425)	**(313,146,963)**	**(1,222,419,785)**	**(301,670,959)**
ගෙවූ බදු		(52,514,615)	(522,778,918)	(52,514,615)	(521,639,115)
ගෙවූ පාරිතෝෂික		(11,485,605)	(8,341,744)	(11,485,605)	(8,341,744)
		(64,000,220)	**(531,120,661)**	**(64,000,220)**	**(529,980,858)**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් කටයුතුවලින් ආයතනය තුළට ගලා ආ/ ආයතනයෙන් පිටතට ගලා ගිය ශුද්ධ පිටතට ගලා ගිය ශුද්ධ මුදල් ප්‍රවාහය		**(1,282,051,647)**	**(844,267,625)**	**(1,286,420,005)**	**(831,651,818)**
ලැබිය යුතු ලැබීම් වැඩිවීම්/ අඩුවීම්	**i**	(76,050,191)	(92,453,988)	(75,774,690)	(92,135,814)
වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් (කුවේට් අරමුදල)		-	50,676,848	-	50,676,848
ණය හිමියන්ගේ වැඩිවීම්/ අඩුවීම්	**ii**	357,716,355	185,394,290	360,006,332	206,764,227
		281,666,164	**143,617,150**	**284,231,642**	**165,305,261**
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ/ පිටට ගියශුද්ධ මුදල් ප්‍රවාහය		**(1,000,385,482)**	**(700,650,474)**	**(1,002,188,363)**	**(666,346,556)**
ආයෝජන කටයුතු වලින් ඇති වූ මුදල් ප්‍රවාහය					
දේපොළ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අත්පත් කර ගැනීම්		(25,241,066)	(113,043,232)	(8,553,530)	(112,947,557)
දේපල, යන්ත්‍ර හා උපකරණ බැහැර කිරීමෙන් උත්පාදිත ආදායම		255,000	10,480,897	209,850	10,480,897
විනිමය ලාභ			(56,439,176)		(56,228,425)
පොළී ආදායම		928,863,898	1,004,890,788	920,310,859	994,294,952
පොළී වියදම් - SLFRS		-	(27,522,739)	-	(27,522,739)
කාර්යමණ්ඩල වියදම්-SLFRS		-	(24,528,813)	-	(24,528,813)
මූල්‍ය නොවන ප්‍රතිලාභවලින් ණය අයකිරීම්		-	(76,859)	-	(76,859)
මූල්‍ය වත්කම්වල ආයෝජන	**iii**	242,672,278	37,097,199	246,521,392	37,435,048
භාරකාර අරමුදල් අතිරික්තයේ ආයෝජන		-	(1,290,383)	-	(1,290,383)
ආයෝජන කටයුතු වලින් ආයතනය තුළට ගලා ආ/ පිටතට ගලා ගිය ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		**1,146,550,110**	**829,567,678**	**1,158,488,571**	**819,616,123**
මූල්‍ය කටයුතු වලින් ඇති වූ මුදල් ප්‍රවාහය					
මූල්‍ය වියදම්		(33,235,228)	(9,571,659)	(33,154,167)	(9,455,315)
භාවිතයට හිමිකමක් ඇති වත්කම්		(46,836,951)	(10,795,442)	(46,836,951)	(10,795,442)
දිගුකාලීන ණයවලින් ලද ආදායම්		3,450,000	(210,826)	-	-
විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන		-	(17,323,963)	-	(17,323,963)
මූල්‍යම කටයුතු වලින් ආයතනය තුළට ගලා ආ/ පිටතට ගලා ගිය ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		**(76,622,180)**	**(37,901,890)**	**(79,991,118)**	**(37,574,720)**
මුදල් හා මුදල් සමානකාවල ශුද්ධ වෙනස		**69,542,448**	**91,015,315**	**76,309,090**	**115,694,847**
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමානකා		**3,502,602,083**	**3,411,586,767**	**3,490,201,565**	**3,374,506,717**
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමානකා		**3,572,144,531**	**3,502,602,083**	**3,566,510,654**	**3,490,201,565**

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

සටහන i	**සමූහය**	**කාර්යාංශය**
ලැබිය යුතු ලැබීම් වැඩිවීම්/අඩුවීම	රු.	රු.
පරිභෝජන භාණ්ඩ වැඩිවීම්/ අඩුවීම	2,112,424	2,094,009
ගෙවීම් හා අනෙකුත් ලැබීම් වැඩිවීම්/අඩුවීම	(85,511,712)	(85,081,842)
විවිධ අත්තිකාරම්වල වැඩිවීම්/ අඩුවීම	7,349,097	7,213,143
	(76,050,191)	**(75,774,690)**

සටහන ii		
ණය හිමියන්ගේ වැඩිවීම්/ අඩුවීම		
නියෝජිතායතන ණය හිමියන්ගේ වැඩිවීම්/ අඩුවීම	(26,921,074)	(27,141,575)
උපචිත වියදම්වල වැඩිවීම්/ අඩුවීම	14,654,811	15,173,136
ගෙවිය යුතු පාරිතෝෂික	526,194	-
විගමණික ශ්‍රමිකයන්ගේ දායකත්වය වැඩිවීම්/ අඩුවීම	(22,694)	(22,694)
ප්‍රාග්ධන සංචිත වලින් උත්පාදන (කුවේට් වන්දි මුදල්)	219,492,067	219,492,067
අනෙකුත් ණය හිමියන්ගේ වැඩිවීම්/ අඩුවීම	149,987,051	152,505,398
	357,716,355	**360,006,332**

සටහන iii		
මූල්‍ය වත්කම්වල ආයෝජන		
කාර්ය මණ්ඩල ණය වැඩිවීම්/ අඩුවීම	20,871,598	21,286,129
භාණ්ඩාගාර බැඳුම්කර වැඩිවීම්/ අඩුවීම	535,953,423	535,953,423
ස්ථාවර තැන්පතුවල වැඩිවීම්/ අඩුවීම	(314,152,743)	(310,718,160)
	242,672,278	**246,521,392**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍යකරණ වෙනස්වීම් පිළිබඳ සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වන වසර සඳහා

	සමූහය				ශ්‍රී.ල.වි.සේ.නි.කා.					
	ප්‍රාග්ධනය	සමුච්චිත අරමුදල	ප්‍රත්‍යාගණන අතිරික්තය	මුළු ගණන	ප්‍රාග්ධනය	කාර්යාංශය	සුබසාධන අරමුදල	මුළු ගණන	ප්‍රත්‍යාගණන අතිරික්තය	මුළු ගණන
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2019 ජනවාරි 1 දිනට ශේෂය	691,161,789	10,716,980,601	49,522,346	11,457,664,736	691,161,789	5,771,111,007	4,813,309,511	10,584,420,518	41,713,346	**11,317,295,653**
වර්ෂය සඳහා ලාභය		756,402,731		756,402,731		507,668,195	251,750,318	759,418,513	-	**759,418,513**
වෙනත් විස්තීර්ණ ආදායම්		(15,118,552)		(15,118,552)		(15,224,572)		(15,224,572)	-	**(15,224,572)**
වර්ෂය සඳහා ගැලපුම්		(20,307,733)		(20,307,733)		(20,054,615)	-	(20,054,615)	-	**(20,054,615)**
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්		(650,000,000)		(650,000,000)		(650,000,000)		(650,000,000)	-	**(650,000,000)**
එකතුව	**691,161,789**	**70,976,447**	**49,522,346**	**70,976,447**	**691,161,789**	**(177,610,992)**	**251,750,318**	**74,139,326**	-	**74,139,326**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**691,161,789**	**10,787,957,048**	**49,522,346**	**11,528,641,183**	**691,161,789**	**5,593,500,015**	**5,065,059,830**	**10,658,559,845**	**41,713,346**	**11,391,434,980**
2020 ජනවාරි 01 දිනට ශේෂය	691,161,789	10,787,957,048	49,522,346	11,528,641,183	691,161,789	5,593,500,015	5,065,059,830	10,658,559,845	41,713,346	11,391,434,980
ශ්‍රී. ල.මු.වා.ප්‍ර. ගැලපුම් 2015-2018		98,890,164		98,890,164		98,890,164		98,890,164		98,890,164
ශ්‍රී. ල.මු.වා.ප්‍ර. ගැලපුම් සහ විනිමය හුවමාරු ලාභයේ ආරම්භක ශේෂය 2019		(93,323,094)		(93,323,094)		(93,323,094)		(93,323,094)		(93,323,094)
වර්ෂය සඳහා ලාභය	-	(743,891,274)	-	(743,891,274)	-	(262,503,884)	(474,457,471)	(736,961,354)		(736,961,354)
වෙනත් විස්තීර්ණ ආදායම්	-	(50,158,579)	-	(50,158,579)	-	(49,977,107)		(49,977,107)		(49,977,107)
වාහණ ආපසු භාරදීම්	-	-	16,645,000	16,645,000		-	-	-	-	-
වර්ෂය සඳහා ගැලපුම්	-	51,801,965	-	51,801,965	-	-	51,802,119	51,802,119		51,802,119
ඒකාබද්ධ අරමුදල් සඳහා මාරුකිරීම්	-	(22,321,251)	-	(22,321,251)	-	(22,321,251)	-	(22,321,251)		(22,321,251)
එකතුව	-	**(759,002,069)**	**16,645,000**	**(742,357,069)**	-	**(329,235,171)**	**(422,655,352)**	**(751,890,523)**		**(751,890,523)**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**691,161,789**	**10,028,954,979**	**66,167,346**	**10,786,284,114**	**691,161,789**	**5,264,264,844**	**4,642,404,478**	**9,906,669,322**	**41,713,346**	**10,639,544,457**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වන වසර සඳහා

කාර්යාංශ අරමුදල හා සුබසාධක අරමුදල අතර ආදායම් හා වියදම් වෙන් වශයෙන් දැක්වීම

විස්තරය	2020			2019
	කාර්යාංශය	සේ.සු.අ	එකතුව	
	රු.	රු.	රු.	රු.
ආදායම				
බඳවා ගැනීමේ ගාස්තු - නියෝජිතායතන	55,695,239	27,848,150	83,543,389	311,429,143
බඳවා ගැනීමේ ගාස්තු - පුද්ගල	248,586,813	27,759,993	276,346,805	1,017,679,588
කොරියානු බඳවා ගැනීමේ ප්‍රවර්ධන ගාස්තු	-	47,651,524	47,651,524	119,716,033
පහසුකම් ගාස්තු	11,113,600	-	11,113,600	40,584,743
බලපත්‍ර ගාස්තු	41,900,400	-	41,900,400	61,678,558
සෙස් ආදායම	55,016,717	-	55,016,717	198,394,366
කොරියානු පරිපාලන ගාස්තු	5,518,719	-	5,518,719	13,867,900
නැවත ඇතුලත්වීමේ කොරියානු ගාස්තු	6,953,501	-	6,953,501	14,045,689
කොරියානු පුහුණු ගාස්තු	-	24,798,871	24,798,871	67,921,041
පුහුණු ආදායම	-	41,611,779	41,611,779	149,389,882
විදේශ කානාපති කාර්යාල වලින් ආදායම (සටහන 04.1)	24,761,089	249,746,159	274,507,248	1,080,562,140
	449,546,078	**419,416,475**	**868,962,553**	**3,075,269,084**
වෙනත් මෙහෙයුම් ආදායම				
ප්‍රදාන ආදායම	11,240	-	11,240	-
ගුවන් බලපත්‍ර ඒකකයෙන් ලැබුණු කොමිස් මුදල්	194	-	194	162,330
රක්ෂණ වලින් ලැබුණු කොමිස් මුදල් (දේශීය/විදේශීය)	-	(350,147)	(350,147)	52,525,466
විදේශ විනිමය ලාභ	138,084,107	(17,921,306)	120,162,801	(56,228,425)
විවිධ ආදායම (උප සටහන-05.1)	7,650,307	18,671,479	26,321,785	152,907,345
	145,745,848	**400,026**	**146,145,874**	**149,366,715**
අඩුකළා:				
කාර්ය මණ්ඩල පිරිවැය	1,046,803,951	420,690,690	1,467,494,641	1,743,826,083
ආයතනික වියදම්	182,258,907	208,804,120	391,063,027	525,133,978
මෙහෙයුම් වියදම්	244,057,482	54,788,896	298,846,378	326,911,573
මූල්‍ය වියදම්	28,531,917	5,193,995	33,725,912	9,455,315
වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණ	6,378,768	490,355	6,869,123	13,681,253
වෙළඳ ප්‍රවර්ධන වියදම්	8,432,472	739,714	9,172,186	68,785,489
සුබසාධක අරමුදල් හා වෙනත් වියදම්	-	204,269,330	204,269,330	481,486,840
	1,516,463,497	**894,977,100**	**2,411,440,597**	**3,169,280,531**
මූල්‍ය ආදායම -(උප සටහන 7)	764,874,591	703,128	765,577,719	994,294,952
	764,874,591	**703,128**	**765,577,719**	**994,294,952**
බදු අයකිරීමට පෙර ලාභ/ අලාභ	**(156,296,980)**	**(474,457,471)**	**(630,754,450)**	**1,049,650,220**
අඩු කළා: ආදායම් බදු	(106,206,904)	-	(106,206,904)	(290,231,707)
බදු අයකිරීමෙන් පසු ලාභය*	**(262,503,884)**	**(474,457,471)**	**(736,961,354)**	**759,418,513**
වෙනත් විස්තීර්ණ ආදායම	(262,503,884)	(474,457,471)	(736,961,354)	759,418,513
පශ්චාත් රැකියා ප්‍රතිලාභවල ආයුගනන (පාඩු/ලැබීම්)	(49,977,107)	-	(49,977,107)	(15,224,572)
මුළු විස්තීර්ණ ආදායම්	**(312,480,991)**	**(474,457,471)**	**(786,938,461)**	**744,193,941**

* මුළු ආදායම් බදු වියදම් කාර්යාංශය විසින් දරනු ලබයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය තොරතුරු

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (ශ්‍රී.ල.වි.සේ.නි.කා) 1985 අංක 21 දරණ පනත යටතේ (1994 අංක 04 දරණ සංශෝධන පනත සහ 2009 අංක 56 දරණ පනත යටතේ සංශෝධිත) ස්ථාපිත කරන ලද රාජ්‍ය සංස්ථාවක් වන අතර එය දැනට විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය වේ. එහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 234, ඩෙන්සිල් කොබ්බෙකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් ස්වභාවය

1.2.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී.ල.වි සේ.නි.කා.යේ ප්‍රධාන කාර්යයන් වන්නේ ශ්‍රී ලාංකිකයින්ට ඇති විදේශ රැකියා ප්‍රවර්ධනය හා සංවර්ධනය වන අතර රටින් බැහැරව සේවය කරන ශ්‍රී ලාංකිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනය සහ ආරක්ෂාව සුරක්ෂිත කරමින් විදේශ රැකියා ව්‍යාපාරයට සහාය වීම සහ නියාමනය කිරීමයි.

1.2.2 අනුබද්ධිත ආයතනවල කොටස් හිමිකාරත්වය

2020 දෙසැම්බර් 31 සහ 2019 දෙසැම්බර් 31 දින වන විට අනුබද්ධිතායතන හා එහි හිමිකාරත්වය පහත පරිදි වේ.

අනුබද්ධිත	ප්‍රධාන කාර්යයන්	ආයෝජනයේ ස්වභාවය	දෙසැම්බර් 31	
			2020	**2019**
සීමාසහිත ශ්‍රී ලංකා විදේශ රැකියා (පුද්) නියෝජිතායතනය	කුසලතා ප්‍රවර්ධනය සඳහා පුහුණුව සැපයීම විදේශ රැකියා සඳහා බඳවා ගැනීම	අනුබද්ධිත	100%	100%

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත.ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට අවසන් වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ කාර්යාංශය සහ එයට අනුබද්ධිත ශ්‍රී ලංකා විදේශ රැකියා (පුද්ගලික) නියෝජිතායතනය (SLFEA) සමන්විත වේ.

2. මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය, වෙනත් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මූල්‍ය කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) ඇතුළත් 2020 දෙසැම්බර් සහ ඉන්පසු අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (“SLFRS”s), ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (“LKAS”s), ස්ථාවර අර්ථ නිරූපණ කමිටුවේ (“SIC”) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ අර්ථ නිරූපණ කමිටුවේ (“IFRIC”)අදාළ අර්ථ නිරූපණයන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, ඉදිරිපත් කරන ලද සියලුම වසර සඳහා මෙම ප්‍රතිපත්ති නිරන්තරයෙන් භාවිතා කෙරේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

2.2 මූල්‍ය ප්‍රකාශනවල වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRSs/LKASs)අනුව කාර්යාංශයේ සහ එහි පරිපාලිත ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි.

"මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" (3වන පිටුව බලන්න), "අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව" (...වන පිටුව බලන්න) සහ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සමඟ දැක්වෙන ප්‍රකාශයේ දක්වා ඇති පරිදි (03වන පිටුව බලන්න) අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වගකීම භාර ගනී.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නිකුත් කිරීමට අවසර දී ඇත්තේ 2021.04.28 දිනදීය.

2.3 මිනුම් සඳහා පදනම

මූල්‍ය ප්‍රකාශන වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නොමැතිනම්, මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමක් මත සහ ඓතිහාසික පිරිවැය ක්‍රමය යටතේ සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමූහයේ ක්‍රියාකාරී හා වටිනාකම් ඉදිරිපත් කිරීමේ විනිමය වේ.

2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වාර්තා වී ඇති ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සහ ඒ සමඟ ඇති අනාවරණ සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරනය අවශ්‍ය වේ.මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවයේ ප්‍රතිපලයක් ලෙස අනාගත කාල පරිච්ඡේදයන් තුළ බලපෑමට ලක්වූ වත්කම් හෝ වගකීම් සඳහා හොතිකමය ගැලපුමක් අවශ්‍ය වේ.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය විසින් විවිධ තීරණ ගෙන ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණයන්ට වඩාත්ම වැදගත් බලපෑමක් ඇති බව කළමනාකරණය විසින් තක්සේරු කර ඇති දෑ අදාළ මූල්‍ය ප්‍රකාශනවල ඒ ඒ අයිතමවලට අදාල තනි සටහන් වල සාකච්ඡා කර ඇත.

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් හා වගකීම් ප්‍රමාණයට භෞතිකමය ගැලපීමක් සිදු කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති වාර්තාකරණ දිනයේ අනාගතය හා සම්බන්ධ ප්‍රධාන උපකල්පන සහ තක්සේරු කිරීමේ අවිනිශ්චිතතාවයේ අනෙකුත් ප්‍රධාන ප්‍රභවයන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ඒ ඒ අයිතමවලට පහත දැක්වෙන අදාල තනි සටහන් වල සාකච්ඡා කර ඇත.ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ලබා ගත හැකි පරාමිතීන් මත සමූහය සිය උපකල්පන සහ ඇස්තමේන්තු පදනම් කර ගෙන ඇත.කෙසේ වෙතත්, සමූහයේ පාලනයෙන් පරිබාහිරව පවතින, පරිපාලනය කළ නොහැකි වෙළඳපල වෙනස්වීම් හෝ තත්වයන් හේතුවෙන් අනාගත සංවර්ධන තත්වයන් පිළිබඳ පවත්නා තත්වයන් සහ උපකල්පන වෙනස් විය හැකිය. එවැනි වෙනස්කම් සිදු වූ විට ඒවා උපකල්පනවලින් පිළිබිඹු වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැදගත් තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කර ඇති පහත සඳහන් අයිතමයන් පිළිබඳව කළමනාකරණය විසින් සලකා බලන ලදී.

අඛණ්ඩ පැවැත්ම

කළමණාකරනය විසින් ඉදිරි පැවැත්ම පිළිබඳ තක්සේරුවක් කර ඇති අතර, අනාගතය සඳහා ව්‍යාපාරයේ ඉදිරියට යාමට අවශ්‍ය සම්පත් එහි ඇති බවට සෑහීමකට පත්ව ඇත.තවද, සිදුවීම් /

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

තත්ත්වයන් හා සම්බන්ධ කිසියම් ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය නොදන්නා අතර සමූහයේ / කාර්යාංශයට ඉදිරියට යාමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇතිවිය හැකිය. එම නිසා, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව සැකසීමේ පදනම මත සකස් කරනු ලැබේ.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ ගෙන යා හැකි වත්කම් හා වගකීම්වල ද්‍රව්‍යමය ගැලපුමක ප්‍රති පලයක් ලෙස සැලකිය යුතු අවදානමක් ඇති උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයන් පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන් වලට ඇතුළත් වේ:

- ආදායම් බදු (වත්මන් බදු සහ විලම්බිත බද්ද) (සටහන 3.6)
- දේපල, පිරියත සහ උපකරණ නැවත ඇගයීම (සටහන 3.1)
- අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් මැනීම: ප්‍රධාන ක්‍රියාකාරී උපකල්පන (සටහන 3.11)
- ප්‍රතිපාදන සහ අවිනිශ්චිත වියදම් හඳුනා ගැනීම සහ මැනීම: සම්පත් පිටතට ගලා යාමේ සම්භාවිතාව හා
- තරම පිළිබඳ ප්‍රධාන උපකල්පනය (සටහන 3.10.1.2)
- මූල්‍ය වත්කම් හානිකරවීම: අයකර ගත හැකි මුදල පිළිබඳ ප්‍රධාන උපකල්පනය (සටහන 3.7.5)

2.5 සන්සංදනාත්මක තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් වල සඳහන් කර ඇති අවස්ථාවන්හිදී සංසන්දනාත්මක තොරතුරු නැවත සකස් කර ඉදිරිපත් කර ඇත.වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම්, ශ්‍රී.ල.ගි.ප්‍ර. 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අනුකූලව ශ්‍රී.ල.වි.සේ.නි.කා. විසින් පෙර මූල්‍ය වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ අඛණ්ඩව ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත.තවද, වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූල වීමට අවශ්‍ය ඕනෑම තැනක සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කෙරේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන්ට අඛණ්ඩව භාවිතයට ගෙන ඇත.

ජංගම හා ජංගම නොවන වර්ගීකරණය

සමූහය මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වත්කම් හා වගකීම් ඉදිරිපත් කරන්නේ ජංගම/ජංගම නොවන වර්ගීකරණ මත පදනම්වය.

යම් වත්කමක් ජංගම වත්කමක් වන්නේ එය:

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ එය ලබා ගැනීමට අපේක්ෂා කරනවිටකදී හෝ විකිණීමට හෝ පරිභරණය කිරීමට අදහස් කරන අවස්ථාවක
- මූලික වශයෙන් අලෙවිය පිණිස තබා ඇති අවස්ථාවක
- වාර්තාකරණ කාලපරිච්ඡේදයට මාස දොළහක් තුළ මුදල් කර ගැනීමට අපේක්ෂා කරන විට, හෝ
- මුදල් හෝ මූල්‍ය සම කොටස් වාර්තා කිරීමේ කාලපරිච්ඡේදයෙන් අවම වශයෙන් මාස දොළහකට පමණ පසු හුවමාරු කිරීමකට හෝ වගකීමකින් නිදහස් වීමකට භාවිතා කිරීමට සීමාකර නොමැති අවස්ථාවක

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

අනෙකුත් සියළුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ග කෙරේ.

යම් වගකීමක් ජංගම වගකීමක් වන්නේ එය:

- එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කරන අවස්ථාවල
- මූලික වශයෙන් එය වෙළඳාම සඳහා තබා ඇති අවස්ථාවල
- වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු මාස 12ක් එකී වගකීම නිරවුල් කිරීමට ඇති අවස්ථාවලහෝ,
- වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු මාස 12ක් සඳහා වගකීම පියවීම කල්දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැති අවස්ථාවල

සමුහය විලම්භීත බදු වගකීම ඇතුළුව අනෙකුත් සියළුම වගකීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ග කෙරේ.

වත්කම් හා ලැබිය යුතු මුදල්

3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල (ඉඩම් සහ ගොඩනැගිලි) මුලින් පිරිවැය අනුව හඳුනා ගන්නා ඇති අතර පසුව නැවත තක්සේරු කරන ලද ශේෂයන්හි සමුච්චිත ක්ෂයවීම් හා සමුච්චිත හානි/අලාභ තිබේ නම් ඒවා ශුද්ධ ප්‍රත්‍යාංගණන ශේෂයටම ප්‍රකාශ කරනු ලැබේ.වටිනාකමේ සුළු වෙනස්කම් තිබේ නම් පමණක්, දේපල නැවත ඇගයීම සෑම වසර 5 කට වරක් සිදු කරනු ලැබේ.දේපල වටිනාකම්වල සැලකිය යුතු වෙනස්කම් තිබේ නම් නැවත ඇගයීම වාර්ෂිකව සිදු කෙරේ.

පිරියත සහ උපකරණ මුලින් පිරිවැය අනුව හඳුනාගන්නා ඇති අතර පසුව සමුච්චිත ක්ෂයවීම් හා සමුච්චිත හානිවීම් අලාභයන් තිබේ නම් පිරිවැය එය ශුද්ධ වර්තමාන පිරිවැයටම ප්‍රකාශ කෙරේ.එදිනෙදා කළ යුතු අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ආදායම් ප්‍රකාශයේ දැරිය යුතු වියදම් ලෙස හඳුනා ගනු ලබයි.

කිසියම් දේපලක් යන්ත්‍රාගාරයක, උපකරණයක සහ ඒවායේ වැදගත් කොටසක් භාවිත කිරීම තුළින් අනාගතයේදී කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් ලබා ගත නොහැකි බවට මුලින් හඳුනා ගෙන ඇති අවස්ථාවල එකී අයිතමයන් බැහැර කරනු ලැබේ.වත්කම් හඳුනා නොගැනීමෙන් පැන නගින ඕනෑම ලාභයක් හෝ අලාභයක් වේනම් (ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කම් රඳවා ගෙන සිටීමේ වියදම අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ) එය එකී වත්කම් බැහැර කිරීම පිළිබඳව ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

3.1.1 ක්ෂය කිරීම

සින්නක්කර ඉඩම් හැර දේපල, පිරියත හා උපකරණ වැනි සියළු වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලය මත සරල රේඛීය පදනමින් ක්ෂයවීම ගණනය කරනු ලබයි.

ඵලදායි ආයු කාලය හා වත්කම්වල පවතින වටිනාකම ඒ ඒ මූල්‍ය වසර අවසානයේදී ඇගයීමට ලක් කරනු ලබයි.ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වත්මන් හා ඒ ඒ සන් සන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි හා කොටස්වලට බෙදීම් (partition)	වසර 13 1/3
මෝටර් රථ	වසර 5
අනෙකුත් කාර්යාලයීය උපකරණ	වසර 5
පරිඝණක	වසර 4
විදුලි උපකරණ හා උපාංග	වසර 5
සුළු උපකරණ	වසර 2
පුස්තකාල පොත්	වසර 2

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

ලීබඩු හා සවි කිරීම් – දැවමය	වසර 13 1/3
සවි කිරීම් - වානේ	වසර 13 1/3
පුහුණු උපකරණ	වසර 5
බදු පදනමින් ගත් වත්කම්	බදු කාලය පුරා

3.1.2 ප්‍රත්‍යාගණනය
ආදායම් ප්‍රකාශය තුළ මීට පෙර හඳුනා ගනු ලැබූ වත්කම්වල ප්‍රත්‍යාගණන අගය අඩුවීම ප්‍රතිවර්ථනය වීමක් හැරුණු කොට, අනෙකුත් සවිස්තරාත්මක ආදායම්වල හා වත්කම් ප්‍රත්‍යාගණන සංචිතවල සමුච්ඡිත අගය තුළ කිසියම් ප්‍රත්‍යාගණනන අතිරික්තයක් ඇති බවට හඳුනා ගනු ලබයි. වත්කම් ප්‍රත්‍යාගණන සංචිතවල හඳුනා ගනු ලබන එම වත්කම් තුළ පවත්න අතිරික්තයකට හිලව් කරන ප්‍රමාණය හැරුණුවිට, ආදායම් ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන හිඟයක් ඇති බවට හඳුනා ගනු ලබයි.

වත්කම්වල ඉදිරියට ගෙනයාමේ වටිනාකමට අනුව ප්‍රත්‍යාගණන දිනට සමුච්ඡිත ක්ෂයවීම් ඉවත් කරනු ලබන අතර, ශුද්ධ වටිනාකම වත්කම්වල ප්‍රත්‍යාගණන වටිනාකම අනුව නැවත සකස් කරනු ලබයි. විකිණීමේ (බැහැර කිරීම) පදනම මත වත්කම්වලට අදාල කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් ඇති විට එය රඳවා ගත් ඉපැයුම්වලට මාරු කරනු ලබයි. ඉඩම් හා ගොඩනැගිලි පසුකාලීනව ප්‍රත්‍යාගණනය කරනු ලබන විට, ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනට ඇති සාධාරණ වටිනාකම අනුව මුළු වත්කම් ප්‍රත්‍යාගණනය කරනු ලබයි.

3.1.3 ශ්‍රී.ල.වි.සේ.නි.කා සහ සමූහය බදුගැණුම්කරු වූ බදු සඳහා ගිණුම්කරණය
(අ) ROU වත්කම්

ROU වත්කම් මූලිකව මනිනු ලබන්නේ පහත සඳහන් පිරිවැයද සමන්විතවය:

- බදු වගකීමේ මුළික මැණුමේ වටිනාකම;
- බදු ආරම්භක දින හෝ ඊට පෙර ගෙවන ලද යම් ගෙවීමකින් යම් බදු සානුබල දීමනාවක් ලැබුවේ නම් එය අඩුකර එහි වටිනාකම;
- යම් මූලික සෘජු පිරිවැයක්;

ROU වත්කම් පසුව මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ හානි නිසා වන පාඩුව (ඇත්නම්) අඩු කර ලැබෙන පිරිවැයටයි.ROU වත්කම් සාමාන්‍යයෙන් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය හා කල්බදු කාලය සරල රේඛීය පදනමක් මත ක්ෂය කරනු ලැබේ.

(ආ) කල්බදු වගකීම්
බදු වගකීම් මුලින් මනිනු ලබන්නේ එදිනට නොගෙවන කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව ය.කල්බදු ගෙවීම්වලට පහත සඳහන් දේ ඇතුළත් වේ:

- ස්ථාවර ගෙවීම් (ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම් ඇතුළුව), ලැබිය යුතු කල්බදු සානුබල අඩු කළවිට වටිනාකම;

කල්බදු ගෙවීම වට්ටම් කරනු ලබන්නේ කල්බදු තුළ අන්තර්ගත පොලී අනුපාතිකය භාවිතා කරමිනි.එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, සාමාන්‍යයෙන් කල්බදු සම්බන්ධයෙන් සිදු කරනු ලබන්නේ ශ්‍රී.ල.වි.සේ.නි.කා සහ සමූහය, බදුකරුගේ වර්ධක ණය ගැනීම භාවිතා කරමිනි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

සමාන කාලසීමාවක්, ආරක්ෂාවක් සහ කොන්දේසි සහිත සමාන ආර්ථික පරිසරයක් තුළ ROU සඳහා සමාන වටිනාකමක් ඇති වත්කමක් ලබා ගැනීමට අවශ්‍ය අරමුදල් ණයට ගැනීම සඳහා තනි බදුකරුට ගෙවිය යුතු අනුපාතය මෙයයි.මූලික හා මූල්‍ය පිරිවැය අතර කල්බදු ගෙවීම් වෙන් කරනු ලැබේ.එක් එක් කාල සීමාව සඳහා ඉතිරිව ඇති වගකීම් ශේෂය මත ස්ථාවර ආවර්තිතා පොලී අනුපාතිකයක් නිෂ්පාදනය කිරීම සඳහා කල්බදු කාල සීමාව තුළ ලාභ හෝ අලාභය සඳහා මූල්‍ය පිරිවැය අය කෙරේ.ශ්‍රී.ල.වි.ර.නි.කා.සහ සමූහය මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වෙනම රේඛීය අයිතමයක් ලෙස කල්බදු වගකීම් ඉදිරිපත් කරයි.කල්බදු වගකීමේ පොලී වියදම විස්තීරණ ආදායමේ මූල්‍ය පිරිවැය තුළ ඉදිරිපත් කෙරේ.

ආ) කෙටිකාලීන බදු

මාස 12ක් හෝ ඊට අඩු බදු-කාලපරිච්ඡේදයකින් යුත් හා සවිස්තරාත්මක ආදායම තුළ සරල-රේඛීය පදනමකින් හඳුනා ගන්නාවූ බදු කෙටිකාලීන බදු වේ.

3.3 අස්පෘශ්‍ය වත්කම්

3.3.1 හඳුනාගැනීමේ පදනම

යම් වත්කමකින් ආයතනයට අනාගත ආර්ථිකමය ප්‍රතිලාභයක් අත්වේයැයි අපේක්ෂා කළ හැකි වන්නේනම් හා වත්කම්වල පිරිවැය විශ්වසනීය ලෙස ගණනය කළ හැකි වන්නේනම් එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනේ.

3.3.2 මැනීමේ පදනම

වෙන් වෙන්ව අත්පත් කර ගත් අස්පෘශ්‍ය වත්කම් මූලික වශයෙන් හඳුනා ගැණුනු පිරිවැයටම ගණනය කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම යම් සමුච්ඡිත ක්‍රමක්ෂව හා හානි නිසා ඇතිවන පාඩුවක් ඇත්නම් එහි පිරිවැය මිලට වඩා අඩු වනු ඇත.

3.3.3 ඵලදායි ආර්ථිකමය ආයුකාලය හා ක්‍රමක්ෂය කිරීම

අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනයට ගතහැකි දින සිට එහි පැවති කීර්තිනාමය හා වෙළඳ සන්නාමය හැර එකී වත්කම්වල ඇස්තමේනතුගත සපල ආයුකාලය අනුව සරල රේඛීය පදනම මත සිදුවන ලාභ හා අලාභ ක්‍රමක්ෂය ලෙස හඳුනා ගනු ලැබේ. වත්මන් හා සන්සන්දනාත්මක කාලපරිච්ඡේද සඳහා අදාල වන ඇස්තමේන්තුගත සපල ආයුකාල පහත දැක්වේ.

තොරතුරු පද්ධතිය හා වැඩසටහන්	වසර 5

3.3.4 අස්පෘශ්‍ය වත්කම් ඉවත් කිරීම

අස්පෘශ්‍ය වත්කම් බැහැර කළ විට හෝ එකී වත්කම් භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අත් නොවේයැයි අපේක්ෂා කරනවිට අස්පෘශ්‍ය වත්කම් ඉවත් කිරීමසිදුවේ. අස්පෘශ්‍ය වත්කම් ඉවත් කරනවිට අත්වන ලාභ හෝ අලාභ ගණනය කරනු ලැබ එකී ලාභ හෝ අලාභ අදායම් ප්‍රකාශනය මගින් හඳුනා ගනු ලැබේ.

3.3.5 පසුකාලීන වියදම්

පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය සම්බන්ධිත නිශ්චිත වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි වන විට පමණි.අභ්‍යන්තරව ජනනය කරන ලද කීර්තිනාම සහ වෙළඳ සන්නාම සඳහා වන වියදම් ඇතුළුව අනෙකුත් සියලුම වියදම් ලාභය හා අලාභය ලෙස හඳුනා ගනී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

3.4 මූල්‍ය-නොවන වත්කම් හානිකරණය වීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වත්කම් දුර්වල වියහැකි බවට ඇඟවීමක් තිබේද යන්න ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක් එක් වාර්තා කිරීමේ දිනයේදී තක්සේරු කරයි. කිසියම් ලක්ෂණයක් තිබේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරතා පරීක්ෂණයක් අවශ්‍ය වූ විට, ශ්‍රී.ල.වි.සේ.නි.කා. විසින් වත්කම් අය කර ගත හැකි මුදල තක්සේරු කරයි. අනෙකුත් වත්කම් හෝ වත්කම් සමූහයෙන් විශාල වශයෙන් ස්වාධින වන එකී වත්කම්වලින් සැළකිය යුතු ආර්ථික ලාභයක් ඇති ඇති නොවන්නේ නම් මිස වත්කමක සාධාරණ වටිනාකමට වඩා එම වත්කම්වලින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ වැඩිවූ විට හා එයට අඩු විකුණුම් පිරිවැයක් වැය වනවිට එය තනි වත්කමක් ලෙස තීරණය කරනු ලබයි. වත්කමක් රැගෙන යා හැකි මුදල එකී වත්කමින් අයකර ගත හැකි මුදලට වඩා ඉක්මවා ගිය විට, වත්කම දුර්වල යැයි සලකනු ලබන අතර එය අය කර ගත හැකි ප්‍රමාණය සටහන් කර එය බැහැර කරනු ලබයි. භාවිතයේ වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඔවුන්ගේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ බදු ගෙවීමට පෙර වට්ටම් අනුපාතයක් වන අතර එමඟින් වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් මගින් මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත අවදානම් පිළිබිඹු වේ. සාධාරණ වටිනාකම විකිණීම සඳහා අඩු පිරිවැයක් තීරණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු තිබේ නම්, එය සැලකිල්ලට ගනී. එවැනි ගනුදෙනු කිසිවක් හඳුනාගත නොහැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිතා කරයි.

3.5 විදේශ විනිමය

අ) ක්‍රියාකාරී සහ වටිනාකම් ඉදිරිපත් කිරීමේ විනිමය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අයිතම මනිනු ලබන්නේ ආයතනය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් භාවිතා කරමිනි (ක්‍රියාකාරී මුදල්).මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය කාර්යාංශයෙහි ක්‍රියාකාරී සහ වටිනාකම් ඉදිරිපත් කිරීමේ මුදල් වේ.

ආ) විදේශ විනිමය ගණුදෙණු

විදේශීය මුදල්වලින් සිදු කරනු ලබන ගනුදෙනු ගනුදෙනුව සිදු කරන දිනට අදාළ විනිමය අනුපාත යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අදාළ ක්‍රියාකාරී මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ.

වාර්තා කරන දිනයේදී විදේශ මුදල්වලින් දක්වා ඇති සියළුම මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කිරීමේ දිනයේ බලපැවැත්වෙන ප්‍රවර්තන විනිමය අනුපාතය යටතේ නැවත ක්‍රියාකාරී මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ.නැවත පරිවර්තනය කිරීමේදී පැන නගින විදේශ මුදල් වෙනස්කම් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. මුදල් අයිතම නිරවුල් කිරීම හෝ පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් පැන නගින සියලු වෙනස්කම් ආදායම් ප්‍රකාශය මගින් දක්වනු ලැබේ. විදේශ මුදල් වර්ගයක ඓතිහාසික පිරිවැය අනුව ගෙන යන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් ආරම්භක ගනුදෙනුවේ දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. විදේශීය මුදල් වර්ගයක සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මුදල් නොවන භාණ්ඩ සාධාරණ වටිනාකම තීරණය කරන දිනයේ විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ.

මූල්‍යමය නොවන භාණ්ඩ නැවත පරිවර්තනය කිරීමෙන් ඇති වන ලාභය හෝ අලාභය සලකනු ලබන්නේ භාණ්ඩයේ සාධාරණ වටිනාකමෙහි වෙනසක ලාභය හෝ අලාභය හඳුනා ගැනීමෙනි (එනම්, වෙනත් විස්තීර්ණ ආදායම් වලින් හෝ ආදායම් ප්‍රකාශවලින් හඳුනා ගන්නා ලද අයිතමයන් පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ආදායම් ප්‍රකාශවලින් හඳුනාගෙන ඇත).

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

3.6 බදුකරණය

3.6.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු යනු ආදායම මත වර්ෂය සඳහා බදු ගෙවිය යුතු වාර්තා කරන දිනයේ දී පනවන ලද බදු අනුපාත සඳහා ගෙවිය යුතුයැයි අපේක්ෂිත බද්ද වන අතර, සහ පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු බදු සඳහා සිදු කරන ඕනෑම ගැලපීමකි.

වෙනත් විස්තීර්ණ ආදායම් වලින් සෘජුවම හඳුනාගෙන ඇති අයිතමවලට අදාළ ප්‍රවර්තන බද්ද වෙනත් විස්තීර්ණ ආදායම්වලින් හඳුනාගත හැකි වුවද, ආදායම් ප්‍රකාශයෙන් එය හඳුනාගත නොහැක.අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථාවන්ට අදාළව බදු වගීවල තත්වය කළමනාකරණය විසින් වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවලදී අදාල විධිවිධාන ස්ථාපිත කරයි.

3.6.2 විලම්භිත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් හා වගකීම්වල බදු පදනම් සහ එහි ධාරණ වටිනාකම් අතර වාර්තා කිරීමේ දිනට ඇති තාවකාලික වෙනස්කම් පිළිබඳ වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු සපයනු ලැබේ. බදු අය කළ හැකි සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වගකීම් හඳුනාගෙන ඇත.

සියළු අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්, භාවිතයට නොගත් බදු බැර ඉදිරියට ගෙනයාම සහ භාවිතයට නොගත් බදු අලාභ සඳහා විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇත. අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වලට එරෙහිව බදු අය කළ හැකි ලාභයක් ලබා ගත හැකිතාක් දුරට විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇති අතර, භාවිතයට නොගත් බදු බැර කිරීම් සහ භාවිතයට නොගත් බදු අලාභයන් ඉදිරියට ගෙන යා හැකිය.

විලම්බිත බදු වත්කම්වල ධාරණ වටිනාකම සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර, විලම්බිත බදු වත්කම්වලින් කොටසක් හෝ කොටසක් භාවිතා කිරීමට ඉඩ දීම සඳහා ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් තවදුරටත් පවතිනු ඇතැයි සිතිය නොහැකිය. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම නැවත ඇගයීමට ලක් කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය මඟින් විලම්බිත බදු වත්කම් ආපසු අයකර ගැනීමට ඉඩ සැලසෙනතෙක් හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ වත්කම් සාක්ෂාත් කර ගත් විට හෝ වගකීම පියවා ගත් වර්ෂයේ දී අදාළ වන බදු අනුපාතයන් මත ය. එය වාර්තා කරන දිනයේ දී බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද බදු අනුපාත මත පදනම් වේ.

3.7 මූල්‍ය වත්කම්

3.7.1 ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම

ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිත 9 (**SLFRS 9**) **'මූල්‍ය උපකරණ',**අනුකූලව මූල්‍ය වත්කම් ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම සිදු කර ඇත.මූල්‍ය ප්‍රකාශනයේ සටහන් යටතේ ඇති සටහන් 13 මූල්‍ය වත්කම් හෙළිදරව් කර ඇත.

3.7.2 මූලික හඳුනා ගැනීම හා මැනීම

මූල්‍ය වත්කම් සුදුසු පරිදි ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්, ණය හා ලැබිය යුතු මුදල්, කල් පිරෙන තෙක් රඳවා ගන්නා වූ ආයෝජන සහ විකිණීම සඳහා ලබා ගත හැකි මූල්‍ය වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති අතර මූල්‍ය වත්කම්වල වර්ගීකරණය මූලික හඳුනාගැනීමේදී තීරණය කෙරේ.

සියළුම මූල්‍ය ආයෝජන ක්‍රියාවලියේදී වත්කම් මූලිකව සාධාරණ වටිනාකම් හා වත්කම්වල ගණුදෙනු පිරිවැය මත හඳුනා ගන්නා අතර එය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකම මත හඳුනා නොගනී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

3.7.3 පසුකාලීනව සිදු කරන මිණුම්

මූල්‍ය වත්කම් වර්ගීකරණය මත රඳා පවතින මූල්‍ය වත්කම් සඳහා පසුකාලීනව සිදු කරන මිණුම් පහත දැක්වේ.

3.7.3.1 ණය හා ලැබිය යුතු මුදල්

ණය හා ලැබිය යුතු මුදල්යනු සක්‍රිය වෙළඳපලක සඳහන් නොවන ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මුණුම් සිදු කිරීමෙන් අනතුරුව එවන් මූල්‍ය වත්කම් සපල පොලී අනුපාතය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් හානිකාරී වටිනාකම අඩුකර ණය හා ලැබිය යුතු මුදල් මනිනු ලැබේ. අත්පත් කර ගැනීම සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ සපල පොලී අනුපාතයේ අනිවාර්ය අංගයක් වන ගාස්තු හා පිරිවැය සැළකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශයේ සපල පොලී අනුපාත ක්‍රමක්ෂය ඇතුළත් කෙරේ. හානිකරණය (අපචය කිරීම) හේතුවෙන් ඇති වන පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

3.7.3.2 කල් පිරෙනතුරු තබා ගන්නා ආයෝජන

මූල්‍ය වත්කම් කල් පිරෙනතුරු තබා ගැනීමේ ධනාත්මක අරමුණක් හැකියාවක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සතුව ඇති අවස්ථාවලදී ස්ථාවර හා නිර්ණය කළ හැකි ගෙවීම් මෙන්ම ස්ථාවර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල් පිරෙනතුරු තබා ගන්නා ආයෝජන වශයෙන් වර්ගීකරණය කෙරේ. මූලික මිණුම් කිරීමෙන් අනතුරුව සපල පොලී අනුපාතය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයෙන් හානිකරණය අඩු කිරීමෙන් කල්පිරෙන තුරු තබා ගන්නා ආයෝජන මනිනු ලැබේ. අත්පත් කර ගැනීම සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ සපල පොලී අනුපාතයෙහි අනිවාර්ය අංගයක් වන ගාස්තු හා පිරිවැය සැළකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට සපල පොලී අනුපාත ක්‍රමක්ෂය ඇතුළත් කෙරේ. හානිකරණය හේතුවෙන් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනා ගැනේ.

3.7.4 ලේඛනවලින් ඉවත් කිරීම *(De-recognition)*

මූල්‍ය වත්කමක් වාර්තාවලින් ඉවත් කරනු ලබන්නේ (හෝ, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් ඇති සමූහයක කොටසක් අදාල වනවිට),

i) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත්ව අවස්ථාවල,
ii) ශ්‍රී.ල.වි.සේ.නි.කා. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීම සඳහා එහි අයිතිය පවරා දී ඇති අවස්ථාවල හෝ ලැබුණු මුදල් ප්‍රවාහ සැළකිය යුතු ප්‍රමාදයෙන් තොරව තෙවන පාර්ශවයකට ‘ඉන් ඔබ්බට යාමේ’ විධිවිධාන යටතේ සම්පූර්ණයෙන් ගෙවීමට බැඳී සිටින අවස්ථාවල,
iii) ශ්‍රී.ල.වි.සේ.නි.කා. විසින් වත්කම්වල සියළු අවදානම හා ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු කර හෝ රඳවා ගෙන නොමැති වුවද එකී වත්කමේ පාලනය මාරු කර ඇති විට

3.7.5 මූල්‍ය වත්කම් හානිකරවීම (Impairment)

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමුච්ඡයක් හානියට ලක්ව ඇති බවට සාධකමය සාක්ෂි තිබෙදැයි ඒ ඒ වාර්තාකරණ දිනට ශ්‍රී.ල.වි.ස.නි.කා.ඇගයීමට ලක් කරයි. වත්කම් මුලින් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවූ එක් සිද්ධියක් හෝ සිද්ධි සමුදායක ප්‍රතිපලයක් ලෙස හානිකරවීම පිළිබඳව සාධකමය සාක්ෂි තිබෙනම් හා විශ්වසනීය ලෙස ඇගයීම් කළ අනාගත මුදල් ප්‍රවාහයක් මත එම අලාභ සිදුවූ සිදුවීම මගින් බලපෑමක් සිදුවෙනම් පමණක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරවීමකට ලක්ව ඇතැයි සැළකේ.

හානිකරණයවීම හා සම්බන්ධ සාක්ෂීන් ලෙස ගනු ලබන්නේ ණයගැතියන් හෝ ණයගැතියන් කණ්ඩායමක් දැඩි මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණදෙමින් සිටීම, පොලියේ හෝ ප්‍රාග්ධනයේ පැහැර හැරීමක් පැවතීම, ඔවුන් විසින් බංකොලොත්භාවයකට මුහුණපෑම හෝ වෙනත් මූල්‍යමය ප්‍රතිසංවිධානයක් සිදු කිරීම සහ හිඟ මුදල් පැවතීමත් එය ණය පැහැර හැරීමක් සමඟ සහ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

සම්බන්ධතාවයක් පැවතීම වැනි තත්වයන් නිසා මැණිය හැකි ප්‍රමාණවලින් අනාගත මුදල් ප්‍රවාහවල අඩුවීමක් පැවතීමයි.

3.7.5.1 ක්‍රමක්ෂය පිරිවැයට ගනු ලබන මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.වි.සේ.නි.කා. ක්‍රමක්ෂය පිරිවැයට ගනු ලබන මූල්‍ය වත්නම් සඳහා ඒ ඒ මූල්‍ය වත්කම්වලට තනිව පවතින හානිකරණයවීම පිළිබඳව සාධකමය සාක්ෂි පවතින්නේද යන්න ඇගයීමකට ලක් කරයි.

එවැනි හැනිකරණ අලාභයකට තුඩු දෙන සාධකමය සාක්ෂි තිබෙනම් වත්කමේ ධාරණ ප්‍රමාණය (එකී වත්කම විසින් දරනු ලබන වටිනාකම) හා වත්කමේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ (මේවන විට වැය නොකරන ලද අනාගතයේදී අපේක්ෂිත ණය ප්‍රමාණය හැර)අතර වෙනස ලෙස පාඩුව මණිනු ලැබේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමේ මූලික සඵල පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබේ.

යම් වත්කමක ධාරණ වටිනාකම දීමනා ගිණුමක් මගින් අඩු කරනු ලබන අතර, එකී පාඩුව ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. අනාගත අය කර ගැනීම්වල තාත්වික ප්‍රගතියක් නොමැති අවස්ථාවල, එකී ණය හා ඊට අදාලව වෙන් කරනු ලබන දීමනා කපා හරිනු ලැබේ.

දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් වත්කමේ ධාරණ ප්‍රමාණය අඩු කරන අතර අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශනය තුළින් හඳුනා ගැනේ. හානිකරණය හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවන සිදුවීමක් හේතුවෙන් පසුව එළඹෙන යම් වර්ෂයකදී තක්සේරු කළ හානිකරණ පාඩුව වැඩි හෝ අඩු වේනම්, දීමනා ගිණුම ගැලපීම මගින් පෙර හඳුනා ගත් හානිකරණ පාඩුව වැඩි හෝ අඩුවේ. අනාගතයේ සිදුවන කපා හැරීමකින් පසුව අය කරගනු ලැබුවහොත් එකී අය කර ගැනීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදමක් ලෙස බැර කෙරේ.

3.8 පාරිභෝගික භාණ්ඩ

යල්පැනගිය හා මන්දගාමී අලෙවියකින් යුත් අයිතම සඳහා ප්‍රතිපාදන සැපයීමෙන් අනතුරුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට පාරිභෝගක භාණ්ඩ මණිනු ලැබේ.

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත විකුණුම් මිල සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තු පිරිවැයෙන් සහ වැකිණිම සඳහා වැය කිරීම අවශ්‍ය වන ඇස්තමේන්තු කළ පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන වටිනාකමයි.

3.9 මුදල් හා මූල්‍ය සමකොටස්

මුදල් හා මූල්‍ය සමකොටස් සමන්විත වන්නේ අත ඇති මුදල්, බැංකුගත මුදල් සහ අත්පත් කර ගත් දින සිට මාස 3කින් හෝ අඩු කාලයකින් කල්පිරෙන ඉහල ද්‍රවශීලතාවයකින් යුත් කෙටිකාලීන ආයෝජන වේ.

වගකීම් හා ප්‍රතිපාදන

3.10 මූල්‍යමය වගකීම්

මූල්‍ය වගකීම් ශුද්ධ ගණුදෙනු පිරිවැයේ සාධාරණ වටිනාකමකින් මුලින්ම හඳුනාගනු ලබන අතර පසුව අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් සඵල පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. වාර්තාකරණ කාලය අවසානයේ ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරන්නාවූ මාස 12කට වඩා වැඩි කල්පිරීමේ කාලයක් ඇත්නම් හැර ඒවා ජංගම වත්කම්වල අන්තර්ගත කෙරේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

මූල්‍ය වගකීම් වාර්තාවලින් ඉවත් කිරීම
කිසියම් මූල්‍ය වගකීමකට අදාලව ඇති බැඳීම අවසන් වූවිට, එකී මූල්‍ය වගකීම අදාල වාර්තාවලින් ඉවත් කෙරේ.

3.10.1 පසුකාලීනව සිදුකෙරන මිනුම්
මූල්‍ය වගකීම් මැනීම පහත දක්වා ඇති වර්ගීකරණය මත රඳා පවතී.

3.10.1.1 අනෙකුත් මූල්‍යමය වගකීම්
මූලික හඳුනාගැනීමෙන් පසුව, සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් පොළී සහිත ණය සහ ණය ගැනීම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.වගකීම් තවදුරටත් හඳුනානොගත් මෙන්ම ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලියේ සඵල පොළී අනුපාත (EIR) ක්‍රමය තුළින් ද ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීම සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොළී අනුපාතිකයේ (EIR) අනිවාර්ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි.සඵල පොළී අනුපාතය මගින් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් යටතේ ඇතුළත් කරනු ලබයි

3.10.1.2 ප්‍රතිපාදන, බැඳීම් සහ අසම්භාව්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති
වර්තමාන ප්‍රතිපාදන ඇති විට එය අතීත සිදුවීමක ප්‍රතිඵලක් ලෙස කාර්යාංශය (නෛතික හා හිතකර) හඳුනාගනියි. වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලා ඒමක් අවශ්‍ය විය හැකි අතර වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක තක්සේරුවක් කළ හැකිය.කිසියම් ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට සමූහය අපේක්ෂා කරන විට හෝ ප්‍රතිපූර්ණය නිශ්චිත වන විට ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රතිපූර්ණය සඳහා අදාලවන වියදම් ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ.

මුදල්වල කාලීන වටිනාකමේ බලපෑම දැඩ්‍යාත්මක නම්,වර්තමාන බදු ගෙවීමට පෙර අනුපාතයක් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ.වට්ටම් භාවිතා කරන විට, කාලය ගතවීම හේතුවෙන් ප්‍රතිපාදන වැඩිවීම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ ඓතිහාසික අත්දැකීම් සහ එක් එක් අවස්ථාවල නිශ්චිත නියමයන් මත ය. බොහෝ දුරට සිදු විය හැකි ප්‍රතිඵල ඇගයීමක පදනම මත සමූහය ඇස්තමේන්තුවක් වෙත පැමිණේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දන්නා සියලුම ප්‍රතිපාදන ගිණුම්ගත කර ඇත.

අසම්භාව්‍ය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදුවිය නොහැකි හෝ පහසුවෙන් මැනිය නොහැකි වර්තමාන බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කළ හැකි බැඳීම් ය. සම්පත් පිටතට ගලායාම සිදු නොවන්නේ නම් සියලු අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන තුළ සටහනක් ලෙස අනාවරණය වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.
ශ්‍රී.ල.වි.සේ.නි.කාර්යාංශයට එරෙහිව සේවකයින් හා බාහිර පාර්ශව විසින් ගොනු කර ඇති පහත නඩු විභාග වෙමින් පවතින අතර, ඒ අනුව මුළු විවිධ වන්දි මුදල්වල එකතුව රු. 42,847,726කි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

නඩු අංකය	**ශ්‍රී.ල.වි.රැ.නි.කා.යෙන් අපේක්ෂිත වන්දි මුදල (ශ්‍රී.ල.රු.)**
SC/FR/39/17	-
DC/1852/13	10,000,000/-
DC 3895	10,000,000/-
DC/1229/2017	3,000,000/-
LT 8/582/2011	-
LT 6R/7015	2,216,760/-
SC/FR/66/19	10,000,000/-
SC/FR/72/19	5,000,000/-
A/46/2018	600,000/-
A/24/2018	1,358,976/-
A/55/2018	671,990/-

ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත ආයතනය

ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු 5ක් ඇති අතර, දැනට පවතින තත්වය නිසා පහත නඩු සඳහා විධිවිධාන ලබා දී ඇත.

- W.M.A.S.ප්‍රනාන්දු මෙය (තේ) - කොළඹ කම්කරු විනිශ්චය සභාව – LT/01/89/2020
- W.M.A.S.ප්‍රනාන්දු මෙය(සේවිකා) - කම්කරු දෙපාර්තමේන්තුව – CW/Com/02L/202007/368
- ශ්‍රියාණි මාදම්පේ මෙය – කළමනාකරණය සහකාර - කම්කරු දෙපාර්තමේන්තුව – CW/Com/02L/201805/328
- L.K.නජීත් දර්ශන මයා - (හිටපු කළමනාකාර - ව්‍යාපාර සංවර්ධන)- මහාධිකරණය
- එම්/එස් ඉන්ලැබ් වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල - කොළඹ දිස්ත්‍රික් අධිකරණය – DRE/45/2019

3.10.1.3 බදු ඇඟයුම්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2012 සිට 2017 වසර දක්වා ආදායම් බදු සඳහා බදු ඇඟයීම් ලබා දී ඇත. ශ්‍රී.ල.වි.සේ.නි.කා. එකී ඇඟයීම් සඳහා අභියාචනා ඉදිරිපත් කර ඇති අතර එකී අභියාචනා තවමත් අවසන් තීරණ ලබාදී නොමැත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

2012 සිට 2017 දක්වා සිදු කිරීමට ඉතිරිව ඇති ඇගයීම්

	මුදල (රු.)
2013 වසරේ ආදායම් බදු	(2,787,217)
2014 වසරේ ආදායම් බදු	98,450,501
2015 වසරේ ආදායම් බදු	109,043,423
2017 වසරේ ආදායම් බදු	174,431,987
2017 වසරේ ආදායම් බදු	268,971,839
එකතුව	648,110,533

***3.11* විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්**

3.11.1 අර්ථ දක්වන ලද ප්‍රතිලාභ සැළැස්ම – විශ්‍රාමික පාරිතෝෂික
අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැළැස්මට අනුව වාර්තා කරන දිනට මූල්‍ය ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇති වගකීම අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකමයි. LKAS 19 හෙවත් "සේවක ප්‍රතිලාභ" මගින් නිර්දේශ කර ඇති පරිදි අර්ථ දක්වන ලද ප්‍රතිලාභ වගකීම ප්‍රක්ෂේපනගත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කරමින් ස්වාධීන ගණක විශේෂඥයින් විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ක්‍රියාකාරී ලාභ/අලාභවලින් සමන්විත වන බදු මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හඳුනා ගනු ලබන්නේ අනුරූප හර හෝ ණය සමඟ OCI හරහා ඉපැයීම් රඳවා තබා ගැනීම සඳහා වන කාලපරිච්ඡේදය තුළ ය.සේවා පිරිවැය (වර්තමාන සේවා පිරිවැය සහ අතීත සේවා පිරිවැය) සහ ලාභය හෝ අලාභය සඳහා පොලී වියදම් යන කරුණු නිසා ආරෝපණය කර ඇති අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම්වල වෙනස්වීම් හඳුනා ගනී.අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 3.11.4 හි දක්වා ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ඊට අනුබද්ධායතන විසින් අර්ථ දක්වන ලද ප්‍රතිලාභ සැළැස්මේ වගකීම සඳහා බාහිරින් අරමුදල් සම්පාදනය කර නොමැත. කෙසේවෙතත් වගකීම්වලින් නිදහස්වීම සඳහා ආයෝජන වෙන් කරනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පණතට අනුව, යම් සේවකයෙකුට පාරිතෝෂික ගෙවීමේ වගකීමක් ඇති වන්නේ ඔහු/ඇය විසින් අඛණ්ඩව වසර 5ක සේවා කාලය සම්පූර්ණ කළ විටය.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

3.11.2 අර්ථ දක්වන ලද ප්‍රතිලාභ වගකීම් සඳහා ආරම්භක ශේෂයේ සිට අවසන් ශේෂ දක්වා සන්සන්දනය කර ඇති අයුරු පහත වගුවෙන් දැක්වේ.

දෙසැම්බර් 31 දිනට	සමූහය 2020 ශ්‍රී.ල.රු.	සමූහය 2019 ශ්‍රී.ල.රු.	ශ්‍රී.ල.වි.සේ.නි. කා. 2020 ශ්‍රී.ල.රු.	ශ්‍රී.ල.වි.සේ.නි. කා. 2019 ශ්‍රී.ල.රු.
වසරේ ආරම්භක ශේෂය	160,717,288	129,666,120	158,079,070	127,393,144
වර්තමාන සේවා පිරිවැය	13,076,680	9,362,755	12,834,813	9,152,886
පොලී පිරිවැය	17,665,711	14,911,604	17,388,698	14,650,212
ආයුසණක(ලාභ)/අලාභ	50,158,579	15,118,552	49,977,107	15,224,572
	241,618,258	169,059,031	238,279,688	166,420,814

3.11.3 ලාභ, අලාභ හා වෙනත් සවිස්තරාත්මක ආදායම් පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගත් වියදම්

දෙසැම්බර් 31 දිනට	සමූහය 2020 ශ්‍රී.ල.රු.	සමූහය 2019 ශ්‍රී.ල.රු.	ශ්‍රී.ල.වි.සේ නි.කා. 2020 ශ්‍රී.ල.රු.	ශ්‍රී.ල.වි සේ.නි.කා. 2019 ශ්‍රී.ල.රු.
වර්තමාන සේවා පිරිවැය	13,076,680	9,362,755	12,834,813	9,152,886
පොලී පිරිවැය	17,665,711	14,911,604	17,388,698	14,650,212
සැළසුම් වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ				
වෙනත් සවිස්තරාත්මක ආදායම්වලින් හඳුනාගත් ආයුසණකඅතිරික්තය/හිඟය	50,158,579	15,118,552	49,977,107	15,224,572
ආදායම් පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගත් වියදම්	**80,900,970**	**39,392,911**	**80,200,618**	**39,027,670**

3.11.4 ප්‍රධාන උපකල්පන හා ප්‍රමාණාත්මක සංවේදිතා විශ්ලේෂනය

ආයුසණක තක්සේරුකරණ භාවිතා කරමින් අර්ථ දක්වන ලද සැළැස්මේ පිරිවැය තීරණය කරන අතර එහිදී විවිධ උපකල්පන සිදු කරනු ලබයි. ඒවා නම්, වට්ටම් අනුපාතය තීරණය කිරීම, අනාගත වැටුප් වැඩිවීම, කාර්යමණ්ඩලය සේවයෙන් ඉවත්ව යාම හා විශ්‍රාමික වයස (සේවක මරණ අනුපාතය) යන උපකල්පනයි. තක්සේරුකරණයේ ඇති සංකීර්ණ හා එහි දිර්ඝකාලීන ස්වභාවය නිසා අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම මෙකී උපකල්පනවලට දැඩි ලෙස සංවේදී වේ. සියළුම උපකල්පන වාර්තා කරන දිනයේදී සමාලෝචනය කෙරේ.

ප්‍රධාන උපකල්පන හා එහි ප්‍රමාණාත්මක සංවේදිතා විශ්ලේෂනයතවදුරටත් පහත විස්තර කෙරේ.:

3.11.4.1 ඇක්චුවරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (පුද්ගලික සමාගම නම්වූ වෘත්තීය ආයුසණක සමාගමක් විසින් 2020 දෙසැම්බර් 31 වන දිනට විශ්‍රාම වැටුප් තක්සේරුකරණය පිළිබඳ ස්වාධීන තක්සේරුකරණයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

එකී ආයුසණක විශේෂඥයින් විසින් විශ්‍රාම ප්‍රතිලාභ වගකීම ත්කසේරු කිරීමට භාවිතා කරන ලද්දේ " ප්‍රක්ෂේපනගත ඒකක ණය ක්‍රමය " (Projected Unit Credit Method)නම් වූ ක්‍රමයකි. මෙම ක්‍රමය LKAS 19 - "සේවක ප්‍රතිලාභ මගින් නිර්දේශිතය.".

සේවක ප්‍රතිලාභ පිරිවැය තීරණය කිරීමට භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන වූයේ

විස්තරය	**2019**	**2018**
වට්ටම් අනුපාතය (%)	වාර්ෂික 8	වාර්ෂික 11
අපේක්ෂිත වාර්ෂික වැටුප් වර්ධක අනුපාතය (%)	1.84	1.84
කාර්යය මණ්ඩල සේවය හැරයාමේ සාධකය (%)	1	1
විශ්‍රාම වයස (වසර)	60	60

3.11.4.2 සමූහය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම

ඇක්චුවරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (පුද්ගලික සමාගම නම්වූ වෘත්තීය ආයුසණක සමාගමක් විසින් 2020 දෙසැම්බර් 31 වන දිනට සේවක ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන පිළිබඳ තක්සේරුකරණයක් සිදු කරන ලදී. සේවක ප්‍රතිලාභ වගකීය තක්සේරු කිරීමට එකී ආයුසණක විශේෂඥයින් විසින් විශ්‍රාම ප්‍රතිලාභ වගකීම තක්සේරු කිරීමට භාවිතා කරන ලද්දේ "Projected Unit Credit Method". නම් වූ ක්‍රමයකි. මෙම ක්‍රමය LKAS 19 - "සේවක ප්‍රතිලාභ මගින් නිර්දේශිතය.".

සේවක ප්‍රතිලාභ වගකීම් තීරණය කිරීමට භාවිතා කළ ප්‍රධාන උපකල්පන වූයේ:-

විස්තරය	**2020**	**2019**
වට්ටම් අනුපාතය (%)	8	10.5
කාර්යය මණ්ඩල සේවය හැරයාමේ සාධකය (%)	8	8
විශ්‍රිම වයස (වසර)	60	60

3.11.4.3 භාවිතා කරන ලද උපකල්පනවල සංවේදීතාවය

දෙසැම්බර් 31 වන දිනට කළ වැදගත් උපකල්පන සඳහා කළ ප්‍රමාණාත්මක සංවේදිතා විශ්ලේශනය පහත පරිදි වේ.
අර්ථ දක්වන ලද ප්‍රතිලාභ වගකීම් මත වන බලපෑම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

විස්තරය	ශ්‍රී.ල.වි.සේ.නි.කා.	
	2020 (ශ්‍රී.ල.රු.)	**2019 (ශ්‍රී.ල.රු.)**
වට්ටම් අනුපාතයෙන් එක් ප්‍රතිශතයක් අඩු කිරීම	210,863,230	148,084,294
වට්ටම් අනුපාතයෙන් එක් ප්‍රතිශතයක් අඩු කිරීම	244,818,689	169,266,108

ඉහත සංවේදිතා විශ්ලේශනයෙන් තීරණය වන්නේ වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සිදුවන ප්‍රධාන උපකල්පනයන්හි සාධාරණ වෙනස්කම්වල ප්‍රතිශතයක් ලෙස අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම කෙරෙහි ඇතිවන බලපෑම නිස්සාරණය කරන ක්‍රමයක් මතය. සංවේදී විශ්ලේශන පදනම් වී ඇත්තේ වැදගත් උපකල්පනයක වෙනසක් මත වන අතර , අනෙකුත් සියළුම උපකල්පන ස්ථාවරව නොවෙනස්ව පවතී.ඉහතකී උපකල්පන වෙන් වෙන්ව පවතිනවිට උපකල්පනවල වෙනස්කම් සිදු නොවනු ඇතැයි සිතිය නොහැකි බැවින් සංවේදී විශ්ලේශනයෙන් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමවල සත්‍ය වෙනසක් නියෝජනය නොකෙරෙනු ඇත.

3.11.5 අර්ථ දක්වන ලද දායක සැළසුම් - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාල නීතිරෙගුලාසි ආවරණ වන අකාරයට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා දායක වේ. සේවකයින් ආවරණය වන සැළසුම් සඳහා දායක මුදල් ගෙවීම පිළිබඳ වගකීම ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

සේවක අර්ථසාධක අරමුදල
ශ්‍රී.ල.වි.ර.නි.කා.සහ සේවකයින් සේවක අර්ථසාධක අරමුදලට වැටුපෙන් ගෙවිය යුතු වන ප්‍රතිශතය ලෙස පිළිවෙලින් 15% සහ 10% ක දායකත්වයක් ලබා දෙයි.

සේවක භාරකාර අරමුදල
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සේවක භාරකාර අරමුදලට වැටුපෙන් ගෙවිය යුතු වන ප්‍රතිශතය වන 3% ප්‍රතිශතයකින් දායක වේ.

3.12 රාජ්‍ය ප්‍රතිපාදන

3.12.1 වත්කම්වලට අදාල ප්‍රතිපාදන

හාලි-ඇළ, කතරගම හා රත්නපුර පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතුවලට මහ භාණ්ඩාගාරය විසින් රු.***691,*** 161,789 ක මුදලක් ප්‍රතිපාදනය කර ඇත.

2017 වසර දක්වා වත්කම්වලට අදාලව සිදු කළ ප්‍රතිපාදන මූල්‍ය සමකොටස් (*equity*) වාර්තා කර ඇති අතර, එකී වත්කම් අපේක්ෂිත භාවිතය සඳහා සූදානම්ව පවතින විට එකී වත්කම්වල ආයු කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ආදායම් ප්‍රකාශනයේදී හඳුනා ගනු ලබයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

කෙසේවෙතත්, 2018 වසරේදී මහ භාණ්ඩාගාරය විසින් ශ්‍රී.ල.වි.සේ.නි.කා.යේ ප්‍රාග්ධන දායකත්වයක් ලෙස ප්‍රතිපාදන සළකන ලෙස උපදෙස් ලබා දී ඇත.ඒ අනුව අවශ්‍ය වෙනස්කම්ද සිදු කරන ලදී.

ආදායම් හා වියදම්

3.13 ***ආදායම හඳුනා ගැනීම***

අ) ගාස්තුවලින් ලැබෙන ආදායම

පාරිභොගිකයාට එකඟවූ සේවාව නිසි ලෙස ඉටු කර ඒ ඒ සේවා වගකීම සිදු කළ විට සේවාවක් ලබා දීමෙන් ලබන ආදායම ආදායම් වියදම් ප්‍රකාශනයේදී හඳුනා ගැනේ. මෙයට බඳවා ගැනීමේ ගාස්තු, පහසුකම් ගාස්තු, බලපත්‍ර ගාස්තු, සෙස්, කොරියානු පරිපාලන හා නැවත ඇතුළත් වීමේ ගාස්තු, කොරියානු ප්‍රවර්ධන ගාස්තු, කොරියානු පුහුණු ගාස්තු සහ වෙනත් පුහුණු ගාස්තු සහ සියලුම විදේශීය සංචාරක හා සම්බන්ධ ආදායම මුදල් පදනමින් (cash basis)හඳුනා ගැනේ.

ආ) පොලී ආදායම

ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා, සඵල පොලී අනුපාතය (EIR) භාවිතා කරමින් පොලී ආදායම හෝ වියදම සටහන් කරනු ලැබේ, මෙය මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාලයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් නිවැරදිව වට්ටම් කරන අනුපාතයයි., සුදුසු අවස්ථාවලදී, මූල්‍ය වත්කම් හෝ වගකීම්වල ශුද්ධ රැගෙන යන ප්‍රමාණයට.පොලී ආදායම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලබයි.

ඇ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමක් පත හඳුනා ගනු ලබයි.

3.14 වියදම්

වසර තුළ කරන ලද සියළු වියදම් නොසළකා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී දරනු ලබන සියලු වියදම්, වර්ෂයට අදාල ලාභය ගණනය කිරීමේදී ආදායමට ගලපනු ලැබ ඇත.

3.15 සුභසාධන අරමුදල (WF)

1985 අංක 21 දරණ පනතේ 45 වන වගන්තියට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිටත සේවය කරන සේවකයින්ගේ ප්‍රයෝජනය සඳහා සුබසාධන අරමුදල (WF) ස්ථාපිත කර ඇත.සුභසාධන අරමුදල විසින් දැරීමට සිදුවන ආදායම සහ වියදම් අරමුදල විසින් පැහැදිලි කර ඇත.ඊට අමතරව පනතට අනුකූල වන පරිදි ආදායම හා වියදම් වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශයමෙයට අදාලව වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් ඇත.

ඉහත කරුණු වලට අනුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය විසින් සුභසාධන අරමුදල සහ කාර්යාංශයේ ආදායම සහ වියදම් වෙනම සටහනකින් (අංක 15 සටහන) පෙන්වා ඇති අතර අනාවරණය කිරීමේ අරමුණු පදනම් කර, වත්කම් හා වගකීම්වලට අදාල සටහන් වල වෙන වෙනම වත්කම් හා වගකීම් හඳුනාගෙන ඇත. වර්ෂය තුළ සුභසාධන අරමුදලහි වෙනස්වීම් පෙන්වීමට මූල්‍ය කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය යටතේ සුභසාධන අරමුදලසඳහා වෙනම තීරුවක් වෙන් කර ඇත. සුභසාධන අරමුදලහි ආදායම සහ වියදම් පහත පරිදි වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

ආදායම

එකතු කළා: වර්ෂය සඳහා ප්‍රතිපාදන (කුවේට් අරමුදල)	-	50,676,848	-	50,676,848
එකතු කළා: වර්ෂය සඳහා ප්‍රතිපාදන	25,829,025	307,555,670	25,829,025	307,555,670
	237,357,518	**734,307,411**	**239,323,931**	**735,134,021**
අඩු කළා: වර්ෂය තුළ ගෙවූ බදු	(67,827,132)	(522,778,918)	(67,827,132)	(521,639,115)
	169,530,386	**211,528,493**	**171,496,799**	**213,494,906**

18

	සමූහය		ශ්‍රී.ල.වි.සේ.නි.කා.	
	2020	**2019**	**2020**	**2019**
බද්දට පෙර ලාභය	(637,684,370)	1,046,634,438	(630,754,450)	1,049,650,220
ආදායම් බදු සඳහා යටත් නොවන ආදායම	(79,781,620)	(10,608,336)	(71,216,081)	-
ගලපන ලද ලාභය	**(717,465,990)**	**1,036,026,102**	**(701,970,531)**	**1,049,650,220**
ආයෝජන ආදායමක් ලෙස සැළකෙන මුදල	(694,361,638)	(994,294,952)	(694,361,638)	(994,294,952)
අවසර නොමැති වියදම්	265,551,582	192,140,959	261,738,405	189,726,475
ප්‍රාග්ධන දීමනා	(126,325,348)	(155,168,965)	(126,804,958)	(154,422,229)
පාරිතෝෂික ගෙවීම්	(11,485,605)	(8,341,744)	(11,485,605)	(8,341,744)
ස්ථාවර වත්කම් බැහැර කිරීම තුළින් ඇති වූ ගිණුම් ලාභය	(13,949)	(10,339,181)	(13,949)	(10,339,181)
කුලී පදනම මත ගත් වාහනවලට ගෙවූ කුලී	(5,190,250)	(5,610,000)	(5,190,250)	(5,610,000)
ලබා ගතහැකි ගාස්තු/තුලන දීමනා	-	6,547,879	-	6,547,879
ව්‍යාපාරයෙන් ඔබා ගතහැකි ආදායම	**(1,289,291,198)**	**60,960,100**	**(1,278,088,526)**	**72,916,468**
පොලී ආදායම	786,881,589	1,221,947,504	778,316,050	1,206,485,383
ආයෝජන ආදායම	**786,881,589**	**1,221,947,504**	**778,316,050**	**1,206,485,383**
බදු අයකළ හැකි ආදායම	(471,633,668)	1,282,907,602	(499,772,476)	1,279,401,851
අධි ගෙවීම් මත කළ බදු ඉදිරියට ගෙන ආවා	(127,723)		(127,723)	
බදු අයකළ හැකි ආදායම් මත ආදායම් බදු	-	307,178,221	-	307,555,670
බදු අයකළ හැකි ආදායම් මත ආදායම් බදු (කුවේට් අරමුදල)	-	50,676,848	-	50,676,848

විලම්භිත බදු වියදම්/ ආදායම්

	සමූහය		ශ්‍රී.ල.වි.සේ.නි.කා.	
	2020	**2019**	**2020**	**2019**
දේපොළ, යන්ත්‍රසූත්‍ර හා පිරියත වලින් ඇති වූ තාවකාලික වෙනස (ආපසු හැරවීම)	1,366,603,727	1,358,503,923	1,366,603,727	1,358,503,923
පොතෙන් ඉවත් කළ බදු වටිනාකම	(1,007,068,971)	(1,128,241,675)	(1,007,068,971)	(1,128,241,675)
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	(226,794,082)	(158,079,070)	(226,794,082)	(158,079,070)
බදු ගණනය නිසා සිදුවූ ව්‍යාපාරික අලාභ ඉ/ගෙ	(467,648,503)		(467,648,503)	
ශුද්ධ වෙනස	**(334,907,829)**	**72,183,178**	**(334,907,829)**	**72,183,178**
12% ක සම්මත අනුපාතයට අයකළ බදු	(80,377,879)	17,323,963	(80,377,879)	17,323,963
28% ක සම්මත අනුපාතයට අයකළ බදු	-	-	-	-
විලම්භිත බදු වෙන්කිරීම්	**(80,377,879)**	**17,323,963**	**(80,377,879)**	**17,323,963**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 දිනට

19 උපචිත හා වෙනත් ගෙවිය යුතු

	2020	2019	2020	2019
	සමූහය	සමූහය	ශ්‍රී.ල.වි.සේ.නි.කා.	ශ්‍රී.ල.වි.සේ.නි.කා.
	රු.	රු.	රු.	රු.
කාර්යාංශය				
ගැටළු නිරාකරණය හා වැටුප් තැන්පතු	19,575,461	18,835,462	19,575,461	18,835,462
ගෙවිය යුතු වන රඳවාගත් මුදල්	43,188,086	58,115,883	43,188,086	58,115,883
ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු	1,450,505	1,403,267	1,450,505	1,403,267
අයකැමියන්ගෙන් ලබාගත් ඇප මුදල්	25,000	25,000	25,000	25,000
කොරියානු වීසා ගාස්තු සඳහා තැන්පතු	11,673,600	7,879,200	11,673,600	7,879,200
වැට බදු	1,485,667	8,355,789	1,485,667	8,271,428
විවිධ ණය හිමියන්	39,376,480	85,282,818	33,087,113	76,612,904
ටෙන්ඩර් ණය හිමියන්	131,201,632	113,218,911	131,201,632	113,218,911
මුද්දර ගාස්තු	92,350	141,800	92,350	141,800
කුවේට් අරමුදලටගෙවියයුතු මුදල්	141,897,982		141,897,982	
ජාතිය ගොඩනැගීමේ බදු	-	829,034	-	829,034
ආදායක බද්ද	-	33,149	-	33,149
කොරියානු නැවත බඳවා ගැනීමේ ගාස්තු	3,256,875	3,206,875	3,256,875	3,206,875
ගුවන් ප්‍රවේශපත්‍ර මුදල් රැස් කිරීම	5,816,965	5,937,058	5,816,965	5,937,058
රඳවාගත් බදු අඩු කිරීම්	-	2,833,387	-	2,833,387
ඉදිරිපත් නොකළ චෙක්පත්	83,310	83,310	-	-
අනෙකුත් ගෙවියයුතු	1,812,456	1,564,228	-	-
නැවත ගෙවියයුතු තැන්පත්	-	10,000	-	-
ගෙවියයුතු මරණ හිමිකම් ගෙවීම්	7,489,993	7,706,660	-	-
කොරියානු ගිවිසුම්	16,015,000	16,090,000	-	-
ඊශ්‍රායල නැවත ගෙවියයුතු තැන්පත්	15,100,000	15,100,000	-	-
ගෙවියයුතු රක්ෂණ	160	160	-	-
උප එකතුව	**439,541,523**	**346,651,991**	**392,751,237**	**297,343,358**
සුබසාධක අරමුදල				
ලැබුණු රක්ෂණ වන්දි හා වන්දිලාභීන් වෙත ගෙවිය යුතු මුදල්	51,239,587	32,073,228	51,239,587	32,073,228
ගෙවිය යුතු රක්ෂණ වන්දි (යුනියන් රක්ෂණායතනය)	8,626,365	4,898,248	8,626,365	4,898,248
ආපසු ගෙවනු ලබන තැන්පතු- ගෘහස්ථ කාන්තා ශ්‍රමිකයන් සඳහා	668,986,984	664,223,974	668,986,984	664,223,974
පොලිස් නිශ්කාශන වාර්තා - සයිප්‍රස්	-	177,551	-	177,551
ආපසු ගෙවනු ලබන තැන්පතු - සයිප්‍රස්	10,700,000	11,000,000	10,700,000	11,000,000
ආරක්ෂිත ගිණුම් - විදේශ	61,489,787	49,288,795	61,489,787	49,288,795
නැවත මෙරටට ගෙන්වා ගැනීමේ වියදම් සඳහා තැන්පතු	17,212,076	14,907,315	17,212,076	14,907,315
කුවේට් රක්ෂණය සඳහා තැන්පතු	15,460	15,460	15,460	15,460
උප එකතුව	**818,270,259**	**776,584,571**	**818,270,259**	**776,584,571**
මුළු උපචිත සහ වෙනත් ගෙවිය යුතු මුදල්	**1,257,811,782**	**1,123,236,562**	**1,211,021,496**	**1,073,927,929**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 දිනට

20 කුවේට් වන්දි ගිණුම

කුවේටිහි පැවති යුධමය තත්ත්වය හේතුකොටගෙන 1990-1991 දක්වා කාලය තුළ කුවේටිහි සේවයේ නියුතුව සිට හදිසියේ නැවත ශ්‍රී ලංකාවට පැමිණි සුද්ගලයන් සඳහා ලබාදුන් අරමුදල්වල සමුච්චිත පොළිය හා බෙරුම් නොකළ වන්දිමුදල් මෙම ගිණුමට ඇතුලත් වේ. කුවේට් වන්දි සඳහා වූ අරමුදලේ ඇති රුපියල් මිලියන 2000 මූලික ප්‍රාග්ධනය ලෙස යොදා ගනිමින් විගමණික ශ්‍රමිකයන් සඳහා විශ්‍රාම යෝජනා ක්‍රමයක් ඇති කළ යුතු බවට රජය යෝජනා කර ඇත.

21 සම්බන්ධිත පාර්ශවය අනාවරණය කිරීම

සම්බන්ධිත පාර්ශවකරුවන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

21.1 සම්බන්ධිත ආයතන සමඟ කළ ගණුදෙණු

ශ්‍රී.ල.වි.සේ.නි.කා.

	2020.12.31 දිනට රු.	2019.12.31 දිනට රු.
(i) ශ්‍රී.ල.වි.රැ.නි ආයතනය වෙනින් අය කර ගතයුතු මුදල	250,000	250,000
(ii) ශ්‍රී.ල.වි.රැ.නි.ආයතනයට ගෙවන ලද 70% කොමිස් මුදල	1,407,000	3,622,500

(iii) 2020 වර්ෂයේදී පහත සඳහන් විදේශ රැකියා නියෝජිත ආයතනවල බලපත්‍රලාභීන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වශයෙන් කටයුතු කර ඇත. බඳවා ගැනීමේ ගාස්තුවෙන් 70% කොටසක් ඔවුන් වෙත පහත පරිදි ආපසු ගෙවා ඇත.

අධ්‍යක්ෂවරයාගේ නම	නියෝජිතායතනය	ආපසු ගෙවනු ලබන70 %
ඒ.එල්.ඒ. හසාම් මහතා	අල් අකීම් එන්ටප්‍රයිසස්	2,026,500
එම්.එෆ.එම්. ෆනූර් මහතා	ට්‍රාන්ස් ඒෂියා	1,428,000
එල්.අජිත් සිල්වා මහතා	ARA ඔවසීස් කම්පනි	21,000
එම්.එම්.මොහොමඩ් මහතා.	මුනා රෙකෘටමන්ට් ඒජන්සි	924,000

ශ්‍රී.ල.වි.රැ.නියෝජිතායතනය

21.2 ප්‍රධාන කලමණාකාරීත්වය සමඟ කළ ගනුදෙනු

ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් වන්නේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ය.

ප්‍රධාන කලමණාකරණ නිලධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සම්බන්ධව සිදුකරනු ලැබූ වැදගත් ගනුදෙනු කිසිවක් නොමැත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 දිනට

22 මූල්‍ය අවධානම කළමණාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

සමූහය මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් පහත සඳහන් අවධානම්වලට පාත්‍ර වෙයි.

1. ණය අවධානම
2. ද්‍රවශීලතා අවධානම
3. වෙළඳපොල අවධානම

අවධානම් කළමණාකරණ රාමුව
සමූහයේ අවධානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් සැකසීම හා
අධීක්ෂණය කිරීමේ කාර්යය ඇතුළුව සමූහයේ අවධානම්

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මුහුණදෙන අවධානම් හඳුනාගැනීම, අගය කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහාත් සුදුසු අවධානම් සීමා පැනවීම හා පාලනය, අවධානම් අධීක්ෂණය හා සීමාවලට අනුකූලව කටයුතු කිරීම සඳහාත් ශ්‍රී.ල.වි.සේ.නි.කාර්යාංශයේ අවධානම් කළමණාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත. වෙළඳපොලේ තත්ත්වයන්ගේ වෙනස්කම් හා සමූහයේ කටයුතු පිළිබිඹු කිරීම සඳහා අවධානම් කළමණාකරණ ප්‍රතිපත්ති හා ක්‍රම නිරතුරුව සමාලෝචනය කරනු ලබයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අවධානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා පටිපාටිවලට අනුකූලව කළමණාකරණය කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳවත්, සමූහය මුහුණ පාන අවධානමට අදාලව අවධානම් කළමණාකරණ ව්‍යුහය කෙතෙක් දුරය ප්‍රමාණවත්ද යන්න පිළිබඳවත් අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කරයි.

ණය අවධානම
මූල්‍යමය පාඩුවක් හටගැනීමට හේතු වන මූල්‍ය උපකරණ හා අනෙකුත් ලැබීම් යටතේ දක්වා ඇති වගකීම් නොපියවන අවස්ථාවලදී ඇතිවන මූල්‍ය පාඩුව ණය

අවධානම ලෙස හැඳින්වෙයි.

මෙවන විට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය රජයේ භාණ්ඩාගාර බිල්පත්වල හා රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල අරමුදල් ආයෝජනය කර ඇත. එබැවින්, කාර්යාංශයේ ණය අවධානම එතරම් සැළකිය යුතු නොවන බවට කළමනාකරණය විශ්වාස කරයි.

ද්‍රවශීලතා අවධානම

සමූහය විසින් පියවිය යුතු මූල්‍යමය වගකීමක් මුදල් වලින් හෝ වෙනත් මූල්‍ය වත්කමක් මගින් පියවීමේ දුෂ්කරතාවයකට මුහුණදීම ද්‍රවශීලතා අවධානම ලෙස

හැඳින්වෙයි. සමූහයට අනපේක්ෂිත මූල්‍යමය පාඩුවක් හෝ කීර්තිනාමයට කැළලක් අත් නොවන අන්දමින් සාමාන්‍ය මෙන්ම පීඩාකාරී තත්ත්වයන් යටතේ වුවද

එහි මූල්‍ය වගකීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වාගෙන යාමට හැකි වන ලෙස කටයුතු කිරීමට සමූහය කටයුතු කරයි.

ශේෂ පත්‍ර දිනයේ සිට ගිවිසුම්ගත කල් පිරෙන දිනය දක්වා ඉතිරිව ඇති කාල පරිච්ඡේදය පදනම් කරගෙන සමූහයේ හා භාරකාර අරමුදලේ මූල්‍ය වගකීම් අදාළ කල්පිරෙන කාණ්ඩවලට වෙන් කිරීම පහත සඳහන් වගු මගින් විශ්ලේෂනය කර ඇත.

වෙළඳපොළ අවධානම
වෙළඳපොල මිළ වෙනස්වීම් හේතුකොට ගෙන මූල්‍ය බැඳීම්වල ඇති අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම් උච්ඡාවචනය වීමෙන් ඇතිවන අවධානම වෙළඳපොළ අවධානම ලෙස හැඳින්වෙයි. වෙළඳපොළ මිල අවධානම් 4කින් සමන්විත වෙයි. ඒවා නම් පොළී අනුපාත අවධානම, විනිමය අවධානම, භාණ්ඩ මිල අවධානම හා අනෙකුත් මිල අවධානමයි.එනම් මූල්‍ය සම්කොටස්වල මිල අවධානමයි.ආයෝජන විකිණීමට හා මූල්‍ය බැඳීම් ඇතිවීමට හේතුවන ණය, ණය ගැනීම් හා තැන්පතු ඇතුළු වෙළඳපොළ අවධානම් මූල්‍ය බැඳීම් ඇතිවීම සඳහා බලපායි. ලාභය ප්‍රසස්ථ අයුරින් පවත්වා ගනිමින් පිළිගත හැකි පරාමිතීන් ඇතුළත වෙළඳපොල අවධානම් කළමණාකරණය කිරීම වෙළඳපොළ අවධානය කළමනාකරණය කිරීමේ අරමුණ වන්නේ ය.

පොළී අනුපාත අවධානම
වෙළඳපොළ පොළී අනුපාත වෙනස්වීම් හේතුකොට ගෙන මූල්‍ය බැඳීම්වල ඇති අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම් උච්ඡාවචනය වීමෙන් ඇතිවන අවධානම් පොළී අනුපාත අවධානම් ලෙස හැඳින්වෙයි. පාවෙන පොළී අනුපාත යටතේ සමූහයේ දිගු කාලීන ණය සඳහා වෙළඳපොළ පොළී අනුපාත වෙනස්වීමේ අවධානමකට ප්‍රධාන වශයෙන් සමූහය මුහුණ දෙයි.

මූල්‍ය සම්කොටස්වල මිළ
ආයෝජන සුරැකුම්පත්වල අනාගත වටිනාකම් පිළිබඳ ඇති අවිනිශ්චිත බව හේතුකොට ගෙන ඇතිවන වෙළඳපොළ මිල අවධානමට සමූහයේ ලැයිස්තුගත හා ලැයිස්තුගත නොමැති සාධාරණ සුරැකුම්පත් නිරන්තරයෙන්ම පාත්‍ර වෙයි. තනි වශයෙන් හා මුළු මූල්‍ය සම්කොටම් සඳහා සීමා පැනවීමෙන් හා විවිධ ක්‍රම තුළින් මූල්‍ය සම්කොටස්වල මිල අවධානම පාලනය කිරීමට සමූහය කටයුතු කරයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වන වසර සඳහා

23 අනෙකුත් ගණුදෙණු

විදේශ රැකියා ලොතරැයි ජයග්‍රහකයින් සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විවෘත කරනු ලැබූ ස්ථාවර තැන්පත් ගිණුම් 7ක් අවසන් ගිණුම්වල පෙන්වා නොමැත.

ස්ථාවර තැන්පත් ගිණුම් අංක	බැංකුව
20001-90-14730	ජා.ඉ.බැ.
20001-90-14985	ජා.ඉ.බැ.
20001-90-15027	ජා.ඉ.බැ.
20001-90-15051	ජා.ඉ.බැ.
20001-90-15078	ජා.ඉ.බැ.
20001-90-15094	ජා.ඉ.බැ.
20001-90-15892	ජා.ඉ.බැ.

පහත සඳහන් ස්ථාවර තැන්පතු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිව සිටින ශ්‍රී ලාංකික සංක්‍රමිණික සේවකයින්ගේ නිවාස ණය සඳහා බැංකු ඇපකර වශයෙන් තබා ඇත.

ස්ථාවර තැන්පත් ගිණුම් අංක

		රු.
3425	ලංකා බැංකුව	100,000,000.00
204-60-01-000032128	මහජන බැංකුව	50,000,000.00
204-60-01-00006926-8	මහජන බැංකුව	10,000,000.00
204-6001-00025178-3	මහජන බැංකුව	12,895,081.95
204-60-01-00011730-4	මහජන බැංකුව	4,000,000.00
208-60-01-00011145-9	මහජන බැංකුව	5,800,000.00
SMIB-IFD-001116	රා.උ. හා ආ. බැ	108,224,484.36
SMIB-IFD-001129	රා.උ. හා ආ. බැ	17,184,026.40
SMIB-IFD-001133	රා.උ. හා ආ. බැ	17,299,121.10
		325,402,713.81

බැංකු ගිණුම් අංක 1650හි ඇති හඳුනා නොගත් හර
පහත සඳහන් චෙක්පත් දෙක (02) සොරකම් කොට ව්‍යාජ අත්සන් යොදා බැංකුව වෙත් ඉදිරිපත් කර තිබූ බැවින් ඒවායේ වටිනාකම අපගේ ලංකා බැංකු ආයතනික ශාඛාවේ අංක 1650 ගිණුමේ හර කර ඇත.

චෙක්පත් අංක	**බැරකළ දිනය**	**වටිනාකම - රු.**
239481	11.09.2009	400,000
239482	12.10.2009	400,000

මේ සම්බන්ධයෙන් අප විසින් මිරිහාන පොලිස් ස්ථානයේ වංචා වමරිශන අංශයට පැමිණිලි කර ඇති අතර, ඔවුන් විසින් මේ පිළිබඳ විමර්ශන සිදු වෙමින් පවතී. මේ සම්බන්ධයෙන් තවදුරටත් විභාග වෙමින් පවතින නඩුවක් කඩුවෙල මහේස්ත්‍රාත් උසාවියේ විභාග වෙමින් පවතී.

සිදු කළ විනය ක්‍රියාමාර්ග අනුව, සේවකයින් දෙදෙනෙකු (එක් සේවකයෙකු රු. 200,000සහ තවත් සේවකයෙකු රු. 600,000) මෙම මුදල ගෙවිය යුතු වන අතර අදාල අය කර ගැනීම් සිදු වෙමින් පවතී

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VTY/D/SLBFE/01/20

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 දෙසැම්බර් 14 දින

සභාපති

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමෙහි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගනනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමෙහි (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කාර්යාංශයේ සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ ශුද්ධ අගය රු. 1,607,414,606 ක් වූ වත්කම් සම්බන්ධයෙන් 2010 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනයක් කර නොනිබීම හේතුවෙන් එම වත්කම්වල සත්‍ය වටිනාකම්, මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපනය වන වටිනාකම් වලින් අවප්‍රමාණ හෝ අධිප්‍රමාණ වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) කාර්යාංශයට අයත් වටිනාකම රු. 927,432,838 ක් වූ වත්කම් ඒකක 15,664 ක් සහ කම්කරු සුභසාධන අරමුදලට අයත් වටිනාකම රු. 260,519,329 ක් වූ වත්කම් අයිතම 17,518 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වී තිබුණද තව දුරටත් භාවිතා කරමින් පැවතුණි. එම වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව කාර්යාංශය විසින් වාර්ෂික සමාලෝචනයක් සිදුකර නොනිබුණි.

(ඇ) පාවිච්චි කිරීමේ හිමිකම සහිත (Right of use assets) කල්බදු පදනම මත ලබාගත් වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 හි 32 ඡේදය ප්‍රකාරව කල්බදු ගැණුම්කරු වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පටන්ගත් දින සිට වත්කමේ ප්‍රයෝජනවත් ජීවිතකාලය අවසානය දක්වා හෝ කල්බදු වාරය අවසානය යන දෙකෙන් අඩු කාලය තුළ ක්ෂය ගණනය කිරීම සිදුකල යුතු වුවද, කාර්යාංශය ලබාගෙන තිබූ පාවිච්චි කිරීමේ හිමිකම සහිත වාහන 5 ක් සම්බන්ධයෙන් අඩු කාලය වූ කල්බදු වාරය පදනම් කරගෙන ක්ෂය ගනනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු. 2,694,052 ක් ක්ෂය අඩුවෙන් ගිණුම්ගත වී නිබුණි.

(ඈ) 2015 වර්ෂයේ කාර්යාංශය විසින් රු. 52,000,000 ක බදු පදනම මත ලබාගත් ඉඩම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 ප්‍රකාරව, කල්බදු දේපලක් ලෙස හඳුනාගැනීමෙන් තොරව දේපළ, පිරියත හා උපකරණ යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. එමෙන්ම තවදුරටත් ගෙවිය යුතු රු. 26,000,000 ක් වූ මුදල කල්බදු වගකීම ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්විය යුතු වුවත් එම වටිනාකම විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණි. එම බදු ඉඩමට අදාළව 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 5,720,000 ක් වූ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ස්ථාවර තැන්පත් පොලිය වූ රු. 93,669,604 ක් විදේශ විනිමය හුවමාරු ලාභය ලෙස වරදවා දක්වා තිබීමත්, විදේශ විනිමය හුවමාරු ලාභය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන්

රු. 23,730,274 කින් වැඩියෙන් දක්වා තිබීමත් සහ පෙර වර්ෂයේ විදේශ විනිමය හුවමාරු ලාභයට ගැලපිය යුතු රු. 10,585,113 ක් වර්ෂයේ ලාභයට ගැලපීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය හුවමාරු ලාභය රු. 127,984,991 කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 93,669,604 ක් වූ ස්ථාවර තැන්පත් පොලී ගිණුම්ගත නොකිරීම හා ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු. 1,082,335 කින් ස්ථාවර තැන්පත් පොලිය වැඩියෙන් සටහන් කිරීම නිසා වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලිය රු. 92,587,269 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) විගණනයේදී සිදුකරන ලද ගණනය කිරීම් අනුව, සමාලෝචිත වර්ෂයට අදාලව විලම්බිත බදු අධි වෙන්කිරීම රු. 143,406,716 ක් වූ අතර ඉන් වර්ෂයට අදාල රු. 25,829,025 ක් වූ බදු වියදම ගැලපීමෙන් පසු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි රු. 117,577,691 ක් බදු අධි වෙන්කිරීම ලෙස ගැලපිය යුතු වුවද රු. 106,206,904 ක බදු වියදමක් දක්වා තිබුණි. එසේම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි විලම්බිත බදු වත්කමක් ලෙස රු. 127,248,426 ක් දැක්විය යුතු වුවද රු. 172,343,405 ක විලම්භිත බදු වගකීමක් ලෙස දක්වා තිබුණි.

(ඌ) ගොඩනැගිලි සහ වෙනත් කාර්යාල උපකරණ වල ක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් වර්ෂයට අදාල ක්ෂය රු. 4,485,317 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි හා පරිගණක වලට අදාල සමුච්චිත ක්ෂය රු. 1,097,623,115 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි එම අගය රු. 1,121,258,901 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් දේපල, පිරියත හා උපකරණ වල ශුද්ධ අගය රු. 23,635,786 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී පහත අඩුපාඩු අනාවරණය විය.

(i) කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම ගැලපීමේදී, ගෙවීම් සහ අනෙකුත් ලැබීම් වල වැඩිවීම රු. 15,312,417 ක් වැඩියෙන්ද ජංගම වත්කම් යටතේ සඳහන්ව තිබී රජයේ ආදායමට කපාහැර තිබූ වටිනාකම රු. 21,912,150 ක් වූ surplus trust fund හි අගය සටහන්කර නොතිබීමද කුවේට් වන්දි අරමුදලෙහි වටිනාකම රු. 51,802,119 ක් වැඩියෙන්ද විදේශගත ශ්‍රමිකයන්ගේ දායකත්වය රු. 526,375 කින් වැඩිවීම සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම රු. 29,447,539 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) මුදලින් ලද පොලී ආදායම රු. 611,799,366 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(iii) භාණ්ඩාගාර බැඳුම්කර නිදහස් කිරීමෙන් ලද මුදල රු. 13,463,421ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(iv) මූල්‍ය වත්කම් ආයෝජන ශුද්ධ අගය ලෙජරය අනුව රු. 276,912,664 ක් වුවද, සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම එම අගය රු. 310,718,160 ක ඍණ අගයක් ලෙස දක්වා තිබුණි.

(ඒ) විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම රු. 281,344,569 ක් වූ ශේෂයන්ගෙන් එකතුව රු. 101,481,502 ක් වූ ණය හිමි ශේෂ 64 කට අදාලව ශේෂ තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කරන ලද අතර ඉන් ණයහිමි ශේෂ 14 ක ශේෂ තහවුරු පමණක් විගණනය වෙත ලැබී තිබුණි. එම තහවුරු කිරීම් අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වටිනාකම සහ ශේෂ තහවුරු කිරීම් වල වටිනාකම අතර එකතුව රු.18,030,689 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කාර්යාංශයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කාර්යාංශයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කාර්යාංශයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතය ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම් කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාංශය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

කාර්යාංශය 2015 වර්ෂයේ රු. මිලියන 53 ක වටිනාකමකට වසර 50 ක කල්බදු පදනම යටතේ ලබාගත් ඉඩම කිසිදු ඵලදායී කටයුත්තකට යොදා නොගෙන වසර 06 ක් තිස්සේ නිෂ්කාර්යයව පැවති අතර ඊට අදාලව ලිඛිත ගිවිසුමක්ද නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ නිරීක්ෂණ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමෙහි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම	
(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ ශුද්ධ අගය රු. 1,607,414,606 ක් වූ වත්කම් සම්බන්ධයෙන් 2010 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනයක් කර නොතිබීම හේතුවෙන් එම වත්කම්වල සත්‍ය වටිනාකම්, මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපනය වන වටිනාකම් වලින් අවප්‍රමාණ හෝ අධිප්‍රමාණ වී ඇති බව නිරීක්ෂණය විය.	(අ) රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් මෙම ප්‍රත්‍යාගණනය සිදු කිරීම ආරම්භ කළ මුත් එය අසාර්ථක වූ බැවින් 2022.12.31 දිනට ප්‍රථම පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක් මඟින් ප්‍රත්‍යාගණනයක් සිදු කර 2022 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි.
(ආ) කාර්යාංශයට අයත් වටිනාකම රු. 927,432,838 ක් වූ වත්කම් ඒකක 15,664 ක් සහ කම්කරු සුභසාධන අරමුදලට අයත් වටිනාකම රු. 260,519,329 ක් වූ වත්කම් අයිතම 17,518 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වී තිබුණද තවදුරටත් භාවිතාකරමින් පැවතුණි. එම වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය සහ ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව කාර්යාංශය විසින් වාර්ෂික සමාලෝචනයක් සිදුකර නොතිබුණි.	(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 සහ 8 ට අනුව ක්ෂය ගණනය අවසන් කර ඇති වත්කම් අයිතම සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් 2022.12.31 දිනට ප්‍රථම ප්‍රත්‍යාගණනය සිදු කිරීමෙන් අනතුරුව සහ අදාල ඇස්තමේන්තු සමාලෝචනය මඟින් 2022 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි.

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
(ඇ) පාවිච්චි කිරීමේ හිමිකම සහිත (Right of use assets) කල්බදු පදනම මත ලබාගත් වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 හි 32 ඡේදය ප්‍රකාරව කල්බදු ගැණුම්කරු වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පටන්ගත් දින සිට වත්කමේ ප්‍රයෝජනවත් ජීවිතකාලය අවසානය දක්වා හෝ කල්බදුවාරය අවසානය යන දෙකෙන් අඩුකාලය තුළ ක්ෂයගණනය කිරීම සිදුකළ යුතු වුවද, කාර්යාංශය ලබාගෙන තිබූ පාවිච්චි කිරීමේ හිමිකම සහිත වාහන 5 ක් සම්බන්ධයෙන් අඩුකාලය වූ කල්බදුවාරය පදනම් කරගෙන ක්ෂය ගනනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු. 2,694,052 ක් ක්ෂය අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි.	(ඇ) අදාල වත්කම් වල කල්බදු වාරය අවසන් කර ඇති බැවින් ගිණුම් වලින් ඉවත් කර ඇති අතර තවදුරටත් මේ සඳහා ක්ෂය ගැළපුම් අවශ්‍ය නොවේ.
(ඈ) 2015 වර්ෂයේ කාර්යාංශය විසින් රු. 52,000,000 ක බදුපදනම මත ලබාගත් ඉඩම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 ප්‍රකාරව,කල්බදු දේපලක් ලෙස හඳුනා ගැනීමෙන් තොරව දේපළ, පිරියත හා උපකරණ යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.එමෙන්ම තවදුරටත් ගෙවිය යුතු රු. 26,000,000 ක් වූ මුදල කල්බදු වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්විය යුතු වුවත් එම වටිනාකම විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණි. එම බදු ඉඩමට අදාළව 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 5,720,000 ක් වූ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.	(ඈ)මේ සඳහා අවශ්‍ය නිවැරදි කිරීම් සහිතව ගිණුම් තැබීම 2021 වසරේ සිදු කිරීමට අපේක්ෂා කරමි.

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
(ඉ) ස්ථාවර තැන්පත් පොලිය වූ රු. 93,669,604 ක් විදේශ විනිමය හුවමාරු ලාභය ලෙස වරදවා දක්වා තිබීමත්, විදේශ විනිමය හුවමාරු ලාභය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු. 23,730,274 කින් වැඩියෙන් දක්වා තිබීමත් සහ පෙරවර්ෂයේ විදේශ විනිමය හුවමාරු ලාභයට ගැලපිය යුතු රු. 10,585,113 ක් වර්ෂයේ ලාභයට ගැලපීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය හුවමාරු ලාභයරු. 127,984,991 කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචි තවර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	(ඉ) විනිමය හුවමාරු ලාභ වරදවා දක්වා තිබීම් 2021 වසරේදි නිවැරදි කිරීමට අපේක්ෂා කරමි.
(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 93,669,604 ක් වූ ස්ථාවර තැන්පත් පොලී ගිණුම් ගත නොකිරීම හා ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු. 1,082,335 කින් ස්ථාවර තැන්පත් පොලිය වැඩියෙන් සටහන් කිරීම නිසා වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලියරු.92,587,269 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	(ඊ) වසරේ අදාළ නිවැරදි ගැළපුම් සටහන් මේ වන විට තබා නිවැරදි කර ඇත.
(උ) විගණනයේදී සිදුකරන ලද ගණනය කිරීම් අනුව, සමාලෝචිත වර්ෂයට අදාලව විලම්බිත බදු අයි වෙන්කිරීමරු.143,406,716 ක් වූ අතර ඉන් වර්ෂයට අදාල රු. 25,829,025 ක් වූ බදු වියදම් ගැලපීමෙන් පසු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි රු. 117,577,691 ක් බදු අයිවෙන් කිරීම ලෙස ගැලපිය යුතු වුවද රු.106,206,904 ක බදු වියදමක් දක්වා තිබුණි. එසේම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි	(උ) 2021 වසරේ අවසන් ගිණුම් සැකසීමේ දී අදාළ ගැළපුම් සිදු කිරීමට අපේක්ෂා කරමි.

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
(ඌ) ගොඩනැඟිලි සහ වෙනත් කාර්යාල උපකරණ වල ක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් වර්ෂයට අදාල ක්ෂය රු. 4,485,317ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි හා පරිගණක වලට අදාල සමුච්චිත ක්ෂය රු.1,097,623,115 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි එම අගය රු.1,121,258,901 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් දේපල, පිරියත හා උපකරණවල ශුද්ධ අගය රු. 23,635,786 ක් අඩුවෙන් දක්වා තිබුණි.	(ඌ) 2021 වසරේදී අදාළ වරද නිවැරදි කර ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි.
(එ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂා කිරීමේ දී පහත අඩුපාඩු අනාවරණය විය.	(එ) (i) අදාල ගැලපුම් සමඟ 2021 වර්ෂයේ සංසන්දනාත්මක මූල්‍ය ප්‍රවාහය ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි.
(i) කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම ගැලපීමේදී, ගෙවීම් සහ අනෙකුත් ලැබීම් වල වැඩිවීම රු. 15,312,417 ක් වැඩියෙන් ද ජංගම වත්කම් යටතේ සඳහන්ව තිබී රජයේ ආදායමට කපා හැර තිබූ වටිනාකම රු. 21,912,150 ක් වූ surplus trust fund හි අගය සටහන් කර නොතිබීම ද කුවේට් වන්දි අරමුදලහි වටිනාකම රු. 51,802,119 ක් වැඩියෙන්ද විදේශගත ශ්‍රමිකයන්ගේ දායකත්වය රු. 526,375කින් වැඩිවීම සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම රු. 29,447,539 ක් වැඩියෙන් දක්වා තිබුණි	

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
(ii) මුදලින් ලද පොලී ආදායම රු. 611,799,366 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. (iii) භාණ්ඩාගාර බැඳුම්කර නිදහස් කිරීමෙන් ලද මුදල රු. 13,463, 421ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. (iv) මූල්‍ය වත්කම් ආයෝජන ශුද්ධ අගය ලෙජරය අනුව රු. 276,912,664 ක් වුවද, සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම අගය රු. 310,718,160 ක ඍණ අගයක් ලෙස දක්වා තිබුණි.	ii. අදාල ගැලපුම් සමඟ 2021 වර්ෂයේ සංසන්දනාත්මක මූල්‍ය ප්‍රවාහය ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. iii. අදාල ගැලපුම් සමඟ 2021 වර්ෂයේ සංසන්දනාත්මක මූල්‍ය ප්‍රවාහය ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. iv. අදාල ගැලපුම් සමඟ 2021 වර්ෂයේ සංසන්දනාත්මක මූල්‍ය ප්‍රවාහය ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි.
(ඒ) විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම රු. 281,344,569 ක්වූ ශේෂයන් ගෙන් එකතුව රු. 101,481,502 ක් වූ ණයහිමි ශේෂ 14 කට අදාලව ශේෂ තහවුරු කිරීම් ලබාගැනීමට කටයුතු කරන ලද අතර ඉන් ණයහිමිශේෂ 14 ක ශේෂ තහවුරු පමණක් විගණනය වෙත ලැබී තිබුණි. එම තහවුරු කිරීම් අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වටිනාකම සහ ශේෂ තහවුරු කිරීම්වල වටිනාකම අතර එකතුව රු. 18,030,689 ක වෙනසක් නිරීක්ෂණය විය.	(ඒ) විදේශ රැකියා නියෝජිත ආයතන මගින් පවත්වගෙන යනු ලබන ගිණුම්කරණ පද්ධති සහ ගිණුම් ශේෂයන් පිළිබඳ කාර්යාංශයට තහවුරු කිරීමක් සිදුකළ නොහැක. නමුත් කාර්යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් පද්ධති ක්‍රියාවලිය තුළින් බැංකු පිළිපත් සහ ආපසු ගෙවනු ලබන 70% ක ඒජන්සි භාගය පිළිබඳ පරීක්ෂාව තුලින් අදාල ශේෂයන් පිළිබඳ තවදුරටත් තහවුරුවක් ලබා ගත හැක.

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළමතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. **1.3 කාර්යාංශයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.** --- මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන කාර්යාංශයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වග කිවයුතුය. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගතහැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.	

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
කාර්යාංශයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබෙනම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත. **1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්** --- මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස්කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේනම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.	

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂාකිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම් වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. **2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** --- 2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ. 2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාංශය පවත්වාගෙන ගොස් තිබුණි. 2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවේ. 2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.	

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමාකිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.	
2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.	
2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූලනොවන ලෙස ක්‍රියාකර ඇති බව.	
2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.	
2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.	

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
2.3 වෙනත්කරුණු ---------- කාර්යාංශය 2015 වර්ෂයේ රු.මිලියන 53 ක වටිනාකම කට වසර 50 ක කල්බදු පදනම යටතේ ලබාගත් ඉඩම කිසිඳු ඵලදායී කටයුත්තකට යොදා නොගෙන වසර 06 ක් තිස්සේ නිෂ්කාර්යයව පැවති අතර ඊට අදාලව ලිඛිත ගිවිසුමක්ද නොතිබුණි.	හෝමාගම මාහේනවත්ත ප්‍රදේශයේ හෙක්ටයාර 1.9510 ක ප්‍රමාණයකින් යුතු ඉඩමක් කාර්යාංශය විසින් අවුරුදු 50ක කාලයක් සඳහා මුළුබදු වටිනාකම රුපියල් මිලියන 64 කට යටත්ව බදු වශයෙන් ලබාගෙන ඇත.මේ සඳහා අත්තිකාරම් වශයෙන් රුපියල් මිලියන 26ක මුදලක් 2015.06.16 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවාඇත.ඒ අනුව මෙම ඉඩමේ භෞතික අයිතිය 2016.03.16 දින කාර්යාංශය වෙත පවරා දී ඇත.එමෙන්ම 50 අවුරුදු බදු ගිවිසුම පිළියෙල කිරීම සඳහා පහත ගාස්තු 2019.06.14 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවීම් කර ඇත. නීති ගාස්තුව රු. 750,000.00 මුද්දර බදු රු. 266,000.00 වැට් බද්ද (VAT) රු. 114,795.00 ජා.ගො.බදු (NBT) රු. 15,300.00 **එකතුව රු.1,146,095.00**

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
	කාර්යාංශය වෙත බදු ගිවිසුම සකස් කර ඉදිරි කටයුතු සඳහා යොමුකරන ලෙසට ඉල්ලමින් 2019.08.28 , 2020.01.03 , 2020.12.23,2021.06.08 දිනැති ලිපි නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ(නීති) වෙත යවා ඇත.මේ ගැන නාගරික සංවර්ධන අධිකාරියේ (නීති) අංශය වෙතින් දුරකථනයෙන් කළ විමසීමේදී මෙම ඉඩම් වල නැවත මිණුම් කටයුතු සිදුකළ යුතුව ඇති බැවින් බදු ගිවිසුම පිළියෙල කිරීම ප්‍රමාදවන බව දන්වන ලදී. උක්ත ඉඩමේ කාර්යාංශයේ බඳවා ගැනීමේ අංශයට අදාලව පෙරසැකසුම කරන ලද ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 58/2020 (M - 07)හා 2020.06.27 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබී ඇත. ඒ අනුව උපදේශන ආයතනයක් තෝරාගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා සකස් කර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත 2021.07.27 දින යොමු කරන ලද අතර 2021.11.19 දින තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම පවත්වා ඇත. කෙසේ නමුත් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් අංක BD/CBP/01/01/03-2019 යුතුව අයවැය චක්‍ර ලේඛ අංක:07/2019 හා 2019-12-04 දිනැති චක්‍රලේඛයට අනුව ගොඩනැගිලි පහසුකම් ආදිය වෙනුවෙන් කෙරෙන වියදම් ඇතුළුව සියළුම අත්‍යාවශ්‍ය නොවන වියදම් කපා හැරීමටත්, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක BD/CBP/01/01/06-2020 යුතුව ජාතික අයවැය චක්‍ර ලේඛ අංක:05/2020 හා 2020.09.03 දිනැති චක්‍රලේඛයට අනුවරාජ්‍ය ආයතන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම වසර දෙකකින් කල් දැමීමට කටයුතු කලයුතු බවට ප්‍රකාශයට පත් කර ඇත.

විගණකාධිපතිගේ වාර්තාව	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
	නමුත් PR/02/05/61 හා 2020.10.06 දිනැති ලිපිය මගින් මෙම යෝජිත ඉදිකිරීම් කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙස විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමා වෙත ඉල්ලීම් ලිපියක් යොමුකර ඇත. මුදල් අමාත්‍යාංශය මගින් 2021.07.28 දිනැතිව නිකුත් කල ජාතික අයවැය චක්‍රලේඛ 01/2021 ප්‍රකාරව අංක 2.3 හි (අ) හි අංක i යටතේ ද නව ගොඩනැඟිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවීමට දැනටමත් රජය විසින් ගෙන ඇති තීරණය ඉදිරි වර්ෂය සඳහාද අත්හිටවීමට සිදු වන බව සඳහන් කර ඇත. ඒ අනුව, හෝමාගම ඉඩමේ පෙර සැකසුම් කරන ලද ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා PR/02/05/26 Vol.iහා 2021.10.01 දිනැති ලිපිය නැවත වරක් විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමා වෙත යොමුකර ඇත.



අංක 234, ඩෙන්සිල් කොඩිබැකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල

(+94)11-2879900
Hotline – 1989

(+94)11-2879903

www.slbfe.lk

infor_center@slbfe.lk

facebook.com/slbfeOfficial